# ගණිතය

## ගුරු මාර්ගෝපදේශය

(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## 1 ශ්‍රේණිය

පළමුවන වාරය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk
මුද්‍රණය හා බෙදා හැරීම : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ගණිතය

## ගුරු මාර්ගෝපදේශය

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

# 1 ශ්‍රේණිය

# පළමුවන වාරය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

ගණිතය
ගුරු මාර්ගෝපදේශය
1 ශ්‍රේණිය
පළමුවන වාරය

ප්‍රථම මුද්‍රණය - 2025

©ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි.
**ISBN**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : **www.nie.ac.lk**

## විෂයමාලා දායකත්වය

### උපදේශකත්වය

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**ආචාර්ය දර්ශන සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

### අධීක්ෂණය

**ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය**
අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

### විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය | - | අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| හරිනි ගයානා වනසේකර මිය | - | කථිකාචාර්ය, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| කේ. ඩී. නාලනී කළුබෝවිල මිය | - | සහකාර කථිකාචාර්ය (අනුයුක්ත), මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |

### බාහිර සම්පත් දායකත්වය

| | | |
|---|---|---|
| වයි. මානෙල් ගුණසිංහ මිය | - | (විශ්‍රාමික) අධ්‍යක්‍ෂ, ප්‍රාථමික අධ්‍යාපන අංශය, අධ්‍යාපන අමාත්‍යංශය |
| ශ්‍යාමලී බරණගේ මිය | - | (විශ්‍රාමික) විදුහල්පති |
| උදයංගනී තෙන්නකෝන් මිය | - | ගුරු සේවය, මප/මහ/තක්ෂිලා විදුහල, මහනුවර |
| ඩී. එස්. දමයන්ති දැරණියගල මිය | - | ගුරු සේවය, බප/හෝ/කළුඅග්ගල ශ්‍රී සිද්ධාර්ථ ක.වි බොරළුගොඩ, වග |

### භාෂා සංස්කරණය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. කරුණාරත්න මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම |

### පිටකවරය හා චිත්‍ර නිර්මාණය

| | | |
|---|---|---|
| කාංචනා ආර්. පද්මපෙරුම මිය | - | ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |

### පරිගණක අක්ෂර සංයෝජනය (පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණය)

| | | |
|---|---|---|
| ආර්. එම්. රජිත සම්පත් මයා | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| කාංචනා ආර්. පද්මපෙරුම මිය | - | ජාතික අධ්‍යාපන ආයතනය |

### විවිධ සහය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.එච්. ටියුඩර් සිල්වා මයා | - | කළමනාකරණ සහකාර ජාතික අධ්‍යාපන ආයතනය |

# අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය

# පෙරවදන

## හැඳින්වීම

2026 වසරේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව යටතේ පළමුවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දුන් ගණිතය විෂයමාලා රාමුවට අනුකූල ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීමට සඳහා ගුරුවරුන්ට සහය වීම පිණිස මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

පළමුවන වාරයට අදාළ ගණිත සංකල්ප සහ ඉගෙනුම් පල ද ඒ අනුව හඳුනා ගත් විෂය අන්තර්ගතය සහ කාර්ය සාධන ප්‍රමිති ද මෙහි අන්තර්ගත ය. එමෙන් ම සිසුන් තක්සේරු කිරීම සඳහා තක්සේරු නිර්ණායක ද එක් එක් ඉගෙනුම් පල යටතේ ඉදිරිපත් කර ඇත.

පළමුවන ශ්‍රේණියේ ගණිතය විෂය සඳහා සතියකට පැය තුනයි මිනිත්තු තිහක කාලයක් වෙන් කර ඇත. එය සුදුසු ලෙස සතියේ දින පහට වෙන් කර ගත හැකි ය.

පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරය සඳහා සිසුන්ට ලබා දිය යුතු ගණිත සංකල්ප මෙම ගුරු මාර්ගෝපදේශයේ ඉදිරිපත් කර ඇති අතර, වාරයට අදාළ පාඩම් මාතෘකා සහ ඒ සඳහා වෙන් කළ යුතු කාලය ද ඉගෙනුම් ඉගැන්වීම් අනුක්‍රමය යටතේ සඳහන් කර ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගැනීම සඳහා උපකාරී වන ලෙස මෙම ගුරු මාර්ගෝපදේශයේ එක් එක් මාතෘකාව යටතේ කෙටි හැඳින්වීමක් සහිත ව අදාළ විෂය අන්තර්ගතය සහ ඉගෙනුම් පල ද කාර්ය සාධන ප්‍රමිති සහ තක්සේරු නිර්ණායක ද දක්වා ඇත. එම ඉගෙනුම් පල කරා සිසුන් ළඟා කර වීමට සුදුසු ක්‍රියාකාරකම් ද යෝජනා කර ඇති අතර එම යෝජනා කර ඇති ක්‍රියාකාරකම් අනිවාර්ය නො වේ. අදාළ ඉගෙනුම් පලවලට ළඟා වීම සඳහා සුදුසු සිසුන්ගේ අවශ්‍යතාවලට සහ පාසලේ ඉගෙනුම් පරිසරයට උචිත වන ආකාරයේ ක්‍රියාකාරකම් සකස් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. එක් එක් පාඩම් යටතේ යොදා ගන්නා ඉගෙනුම් සම්පත් සහ ගණිත වාංමාලාව ද ඉදිරිපත් කර ඇත. එමෙන් ම ක්‍රියාකාරකම්වලදී සිසුන් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වන මගපෙන්වීම් ද ඇතුළත් ය.

පළමුවන ශ්‍රේණියේ සිසුන් සඳහා ගණිතය ක්‍රියාකාරකම් පොත් වාර තුනට තුනක් වෙන වෙන ම සකස් කර ඇත. ඒවායේ ඇතුළත් ක්‍රියාකාරකම් සංකල්ප තහවුරු කිරීමේදී අදාළ ලෙස භාවිත කළ යුතු ය.

**අධ්‍යක්ෂ,**
**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන**

# විෂය නිර්දේශය

ගණිත දැනුම හා කුසලතා ජීවිතයේ එදිනෙදා කටයුතු හා සම්බන්ධ විවිධ අවස්ථාවල දී නිතර භාවිත කිරීමට සිදු වේ. එනිසා ගණිත සංකල්ප හා මූලධර්ම පිළිබඳ කුසලතාවක් තිබීම වත්මන් සමාජයේ ජීවත් වීම සඳහා පුද්ගලයකුට අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. ගණනය කිරීම, මැනීම, සංඛ්‍යාමය තොරතුරු සංවිධානය හා විශ්ලේෂණය කිරීම, නිමානය, ගැටලුවලට විසඳුම් සෙවීම, තර්කානුකූල ව සිතීමට හුරු වීම සහ තීරණවලට එළඹීම එබඳු අවස්ථාවලට නිදසුන් කිහිපයක් වේ. මේ නිසා පාසල් විෂයමාලාවේ ගණිතය විෂයයට ඉතා වැදගත් තැනක් හිමි වේ.

දැන්වීම්, පුවත්පත්, ගුවන් විදුලි හා රූපවාහිනී වැනි සන්නිවේදන මාධ්‍ය ඔස්සේ සංඛ්‍යා, වගු සහ ප්‍රස්තාර මගින් ඉදිරිපත් වන තොරතුරු නිසි අයුරින් අවබෝධ කර ගැනීමට හැකි වීම සඳහා ද ගණිත නිපුණතා වර්ධනය වී තිබීම අවශ්‍ය වේ.

ඍජුව ම ගණිත ක්ෂේත්‍රයට අදාළ විවිධ වෘත්තීන්හි නියැළීම සඳහා මූලික අඩිතාලම දැමීම මෙන් ම වෙනත් විවිධ වෘත්තීන්හි දී සහ එදිනෙදා අවශ්‍ය කටයුතු ඉටු කර ගැනීමට අවශ්‍ය වන ගණිත කුසලතා ලබා දීම ප්‍රාථමික අවධියේ දී බලාපොරොත්තු වේ.

**ගණිතය විෂය අරමුණ (Aim of the Subject)**

නිර්මාණශීලී තර්කනයෙන් යුක්ත ව දෛනික ජීවිතයේ ගැටලු විසඳීම, ඵලදායී සන්නිවේදනය, ගණිතයේ මූලධර්ම ආශ්‍රිත භාවිත සහ අන්තර් විෂය කුසලතා සහිත ව යාවජීව අධ්‍යාපනය සඳහා අවශ්‍ය පදනම ශක්තිමත් කිරීම.

**1 - 5 ශ්‍රේණි සඳහා ගණිතය විෂය අභිමතාර්ථ (Objectives)**

- ගණිතමය මූලධර්ම භාවිත කරමින් එදිනෙදා ජීවිතයේ හමුවන ගැටලු විසඳීම සහ විවිධ කාර්යවලට අවශ්‍ය දළ අගයන්, නිමානයන් හා නිරවද්‍ය මිනුම් ලබා ගැනීමේ හැකියාව සංවර්ධනය කිරීම.
- සන්නිවේදනයේ දී වාචික, ලිඛිත හා රූපික ක්‍රම භාවිතය පිළිබඳ කුසලතා සංවර්ධනය කර ගැනීමට අවස්ථා සම්පාදනය කිරීම.
- ස්වාධීන නම්‍ය මනසකින් හා ආත්ම විශ්වාසයෙන් යුතු ව පැහැදිලි ලෙස හා තර්කානුකූලව සිතීමේ හැකියාව සංවර්ධනය කිරීම.
- ගණිතය විෂය ඉගෙනුම මගින් ලබන දැනුම, කුසලතා හා ආකල්ප වෙනත් විෂයයන් ඉගෙනීමට උපයෝගී කර ගනිමින් තව දුරටත් ඉගෙනීම සඳහා අවශ්‍ය පදනම සැකසීම.
- නිර්මාණශීලි, බුද්ධි ප්‍රබෝධක හා විනෝදජනක අවස්ථා මඟින් ගණිතය විෂය කෙරෙහි සුබවාදී ආකල්ප ඇති කර වීම.

## ප්‍රධාන සංකල්ප සහ ක්‍රියාකාරී නිර්වචන (Key Concepts and Working Definitions)

**සංඛ්‍යා භාවිතය**

ප්‍රමාණාත්මක වටිනාකම, සංකේත භාවිතයෙන් නිරූපණය කිරීම සහ අනුපිළිවෙළ හඳුනා ගනිමින් ගණන් කිරීම වැනි එදිනෙදා ජීවිතයේ විවිධ කාර්යයන් සඳහා සංඛ්‍යා අර්ථාන්විත ව යොදා ගැනීම.

**සංඛ්‍යාමය ගණනය කිරීම**

සංඛ්‍යා භාවිතයෙන් එකතු කිරීම, අඩු කිරීම, ගුණ කිරීම සහ බෙදීම යන මූලික ගණිත කර්මවල නිරත වීම.

**මිණිතය**

එකඟ වූ ප්‍රමාණයකට (ඒකකයකට) සාපේක්ෂ ව කාලය, දිග, බර සහ ද්‍රව ප්‍රමාණ හඳුනා ගැනීම.

**මුදල් හා ගනුදෙනු**

භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ දී වර්තමානයේ භාවිත වන මුදල් ඒකක, නිවැරදි ව ඵලදායි ලෙස පරිහරණය කිරීම.

**හැඩ හා අවකාශ භාවිතය**

අවට පරිසරයේ හඳුනා ගත හැකි ත්‍රිමාන සහ ද්විමාන හැඩ අවකාශය තුළ විවිධ අයුරින් හසුරුවමින් රටා, නිර්මාණ හා ආකෘති ගොඩනැඟීම.

**දත්ත හැසිරවීම**

තමන්ට සමීප පරිසරයේ සිදු වන සංසිද්ධි ඇසුරෙන් තොරතුරු රැස් කිරීම, වාර්තා කිරීම, වගු හා ප්‍රස්තාර මගින් නිරූපණය කිරීම සහ ඉදිරිපත් කර ඇති තොරතුරු විග්‍රහ කිරීම.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පළමුවන ශ්‍රේණියේ දරුවන්ට සෙල්ලම්, විනෝදජනක වැඩ සහ ක්‍රියාකාරකම් සඳහා වැඩි අවස්ථා ලැබෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම අපේක්ෂා කෙරේ. සිත්ගන්නා සුළු ඉගෙනුම් ද්‍රව්‍ය භාවිතය මගින් ගණිතය ඉගෙනුම කෙරෙහි ඇල්ම හා ආශාව දරුවන් තුළ ඇති කිරීමේ වගකීම හා වගවීම ගුරුවරයා සතු ය.

මෙහිදී යොදා ගන්නා ක්‍රියාකාරකම් චින්තන හා තර්කන ශක්තීන් ද බුද්ධිය ද වර්ධනය කෙරෙන, ගණිතය විෂයයට හා වයස් මට්ටමට ගැළපෙන ඒවා වීමද අවශ්‍ය ය. එමෙන් ම පන්ති කාමරය තුළ දී හෝ පන්ති කාමරයෙන් පිටත දී හෝ සුතත්‍ය ඉගෙනුම් අවස්ථා ලබාදීම ද වැදගත් ය.

මෙවන් ක්‍රියාකාරකම් සාර්ථකව කිරීමට සමත්වීම නිසා ආත්ම විශ්වාසය වර්ධනය වීම, තවදුරටත් ක්‍රියාකාරකම්වල නිරතවීමට පෙළඹවීමක් ඇති වීම, ස්වයං පෙළඹවීම සහ ආත්මාභිමානය වර්ධනය වීම වැනි වාසි රැසක් දරුවන් ළඟා කරගනු ඇත.

# ඉගෙනුම් ඉගැන්වීම් අනුක්‍රමය

## පළමුවන වාරය



| අනු අංකය | අන්තර්ගතය | කාලය (පැය) | පිටු අංකය |
|---|---|---|---|
| 1 | පූර්ව ගණිත සංකල්ප - තේරීම | 07.00 | 1 - 9 |
| 2 | පූර්ව ගණිත සංකල්ප - සැසඳීම | 03.30 | 10 - 13 |
| 3 | පූර්ව ගණිත සංකල්ප - එකට එක අනුරූපතාව | 03.30 | 14 - 17 |
| 4 | පූර්ව ගණිත සංකල්ප - අසර | 03.30 | 18 - 19 |
| 5 | පූර්ව ගණිත සංකල්ප - පටිපාටිගත කිරීම | 03.30 | 20 - 22 |
| 6 | රටා ගොඩනැඟීම | 03.30 | 23 - 25 |
| 7 | 10 තෙක් ද්‍රව්‍ය සහ රූප ගණන් කිරීම | 03.30 | 26 - 30 |
| 8 | 1 සිට 5 තෙක් සංඛ්‍යා හඳුනා ගැනීම | 07.00 | 31 - 34 |

# 1 පූර්ව ගණිත සංකල්ප - තේරීම

මෙම සංකල්පය යටතේ විවිධ උපලක්ෂණ අනුව ද්‍රව්‍ය වර්ග කිරීමේ හැකියාව මෙන් ම එම ද්‍රව්‍ය වර්ග කළ ආකාරය ප්‍රකාශ කිරීමේ හැකියාව සිසුන් තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. ක්‍රියාකාරකම් ආරම්භයට පෙර මෙම සංකල්පය යටතේ සඳහන් ඉගෙනුම් පල, කාර්ය සාධන ප්‍රමිති සහ විෂය අන්තර්ගතය පිළිබඳ අවධානය යොමු කරන්න.

ද්‍රව්‍ය තේරීම යටතේ වර්ගය, වර්ණය, හැඩය, තරම සහ වයනය (සිනිඳු සහ ගොරෝසු බව) යන උපලක්ෂණවලින් වරකට එක් උපලක්ෂණයක් අනුව ද්‍රව්‍ය වර්ග කිරීමේ (වෙන් කිරීමේ) අවස්ථාව සිසුන්ට ලබා දිය යුතු ය. අවට පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය හෝ නිර්මාණය කර ගත් ද්‍රව්‍ය හෝ මේ සඳහා උපයෝගී කර ගන්න. එමෙන් ම සිසුන්ට යම් උපලක්ෂණයක් අනුව ද්‍රව්‍ය ගොඩවලට වෙන් කිරීමට ලබා දී ඒවා වෙන් කළ ආකාරය ප්‍රකාශ කිරීමට ද අවස්ථාව දිය යුතු ය.

**වර්ගය අනුව තේරීම**

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. වර්ග තුනක ද්‍රව්‍ය කට්ටලයක් වෙන් කළ ආකාරය විස්තර කරමින් වර්ගය අනුව ගොඩවලට වෙන් කරයි. | ■ වර්ග තුනක ද්‍රව්‍ය කට්ටල තේරීම | 1.1. එක් වර්ගයකින් ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ වර්ග තුනක ද්‍රව්‍ය කට්ටලයක් වර්ගය අනුව ගොඩවල් තුනකට වෙන් කරයි. | 1.1.1 නිවැරදි ව වෙන් කිරීම |
| | | 1.2. වර්ග තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 1.2.1 හේතුව නිවැරදි වීම |

**වාංමාලාව :**

තේරීම වර්ග කිරීම වර්ගය

**ඉගෙනුම් සම්පත්**

- අවට පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය

  උදාහරණ :- ගල් කැට, ගස්වල කොළ, මල්, ඇට වර්ග, බෝතල් මූඩි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- වර්ගය අනුව ද්‍රව්‍ය තේරීමේදී පළමුවෙන් ම ගොඩවල් දෙකකට වෙන් කිරීමට හැකි වන ආකාරයේ එකිනෙකට වෙනස් වර්ග දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් යොදා ගන්න.
- පළමු ව සිසුන්ට නිදහසේ ඔවුන් කැමති ආකාරයකට ද්‍රව්‍ය ගොඩවලට වෙන් කිරීමට ලබා දී ඒවා වෙන් කළ ආකාරය ප්‍රකාශ කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

උදාහරණය :- එකිනෙකට වෙනස් වර්ග දෙකක බෝතල් මූඩි කට්ටලයක් ලබා දී සිසුන් කැමති ආකාරයකට ගොඩවල් දෙකකට වෙන් කරන ලෙස පැවසීම, සිසුන් ඒවා වෙන් කළ පසු ඒ ආකාරයට වෙන් කරන ලද්දේ ඇයි ද? යන්න විමසීම, එය විස්තර කිරීමට අවස්ථාව ලබා දීම.

- මෙහිදී සිසුන්ට තනි තනි ව සහ කණ්ඩායම් වශයෙන් සිදු කළ හැකි ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

- වර්ග දෙකක ද්‍රව්‍ය කට්ටලයක් තේරීම සිසුන් තුළ තහවුරු වූ පසුව **වර්ග තුනක ද්‍රව්‍ය කට්ටලයක්** තේරීමට අවස්ථාව දෙන්න. මේ සඳහා ගුරුවරයාට අවශ්‍ය පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.
- ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී **එදිනෙදා ජීවිතය හා සම්බන්ධ කළ හැකි ක්‍රියාකාරකම්** සඳහා යොමු වන්න.

    **උදාහරණය** - වර්ගය අනුව තේරීම
    වෙළඳපොළට ගොස් නිවසට ගෙනෙන බඩු මල්ලේ තිබෙන බඩු වෙන වෙන ම අහුරන ආකාරය ද, වෙළඳසලක විකිණීමට ඇති ද්‍රව්‍ය වෙන වෙන ම අසුරා ඇති ආකාරය ද මතක් කරන්න. එමෙන් ම මෙම සතිය තුළ කරන පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තේමාවට අදාළ ද්‍රව්‍ය ඇසුරෙන් තෝරා ගැනීමේ ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථාව දෙන්න.

- වරකට එක් උපලක්ෂණයක් අනුව ද්‍රව්‍ය ගොඩවලට වෙන් කිරීමේදී සෑම සිසුවෙකුට ම එක් ද්‍රව්‍ය කට්ටලයක් නොව ද්‍රව්‍ය කට්ටල කිහිපයක් යොදා ගෙන අවස්ථා කිහිපයකදී වර්ග කිරීමට ඉඩ සලසා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි **"ද්‍රව්‍ය තෝරමු"** පාඩමෙහි **ක්‍රියාකාරකම** 1 සඳහා සිසුන් යොමු කරන්න.

**තක්සේරු කිරීම**

සිසුන් ක්‍රියාකාරකම්වල නිරත වී සිටින අවස්ථාවන්හිදී නිරීක්ෂණය සහ ප්‍රශ්න කිරීමෙන් අදාළ හැකියාව අත්පත් කර ගෙන ඇත් ද යන්න තහවුරු කර ගන්න. ප්‍රවීණතාවට නොපැමිණි සිසුන් සඳහා වැඩි අවධානයක් යොමු කර විකල්ප ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1. එක් වර්ගයකින් ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ වර්ග තුනක ද්‍රව්‍ය කට්ටලයක් වර්ගය අනුව ගොඩවල් තුනකට වෙන් කරයි. | 1.1.1 | වර්ගය අනුව නිවැරදි ව ගොඩවල් තුනකට වෙන් කරයි. | වර්ගය අනුව ගොඩවල් තුනකට වෙන් කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 1.2. වර්ග තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය (හේතුව) ප්‍රකාශ කරයි. | 1.2.1 | ගොඩවලට වෙන් කළ හේතුව නිවැරදි ව ප්‍රකාශ කරයි. | ගොඩවලට වෙන් කළ හේතුව ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |

වර්ණය අනුව තේරීම

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 2. වර්ණ තුනක ද්‍රව්‍ය කට්ටලයක් වෙන් කළ ආකාරය විස්තර කරමින් වර්ණය අනුව ගොඩවලට වෙන් කරයි. | ■ හැඩය සහ තරම සමාන වර්ණ තුනක ද්‍රව්‍ය වර්ණය අනුව තේරීම | 2.1 එක් වර්ණයකින් ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ හැඩය සහ තරම සමාන එක ම වර්ගයේ ද්‍රව්‍ය සහිත වර්ණ තුනක ද්‍රව්‍ය කට්ටලයක් වර්ණය අනුව ගොඩවල් තුනකට වෙන් කරයි. | 2.1.1 නිවැරදි ව වෙන් කිරීම |
| | | 2.2 හැඩය සහ තරම සමාන ද්‍රව්‍ය සහිත වර්ණ තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවල් තුනකට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 2.2.1 හේතුව නිවැරදි වීම |

වචනමාලාව :
තේරීම වර්ග කිරීම වර්ණය (පාට)

**ඉගෙනුම් සම්පත්**
- විවිධ වර්ණයේ වස්තු
- වර්ණ කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පරිසරයේ තිබෙන ද්‍රව්‍ය යොදා ගනිමින් ප්‍රායෝගික අවස්ථා ඇසුරෙන් පහත ආකාරයේ ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

**ක්‍රියාකාරකම 1**
- ක්‍රියාකාරකම සිදු කිරීමට පෙර ගෙමිදුලෙහි වගා කර ඇති මල් වර්ග පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පහත කරුණු මතුවන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.
- පිපී තිබෙන මල්වල පාට, මල් වර්ග (එකම වර්ගයේ මල්වල ඇති පාට වර්ග)
- වීඩියෝ දර්ශනයක් මගින් හෝ පින්තූරයක් මගින් හෝ මල් වත්තක් නැරඹීමට අවස්ථාව දෙන්න.
- එක ම හැඩයේ, එක ම වර්ගයේ හා එක ම තරමේ විවිධ වර්ණ මල් සහිත මෝස්තරයක් ඇඳීමට සිසුන් යොමු කරන්න. (අවශ්‍ය නම් හිඩැස්පත් යොදා ගන්න.)

**ක්‍රියාකාරකම 2**
- වර්ණය අනුව තේරීමට අදාළ ව වර්ණ 3කින් යුත් සුදුසු ද්‍රව්‍ය කට්ටල සූදානම් කර ගන්න.


  **උදාහරණය**
  - පාට 3කින් යුතු යුතු බැලුන් බෝල කිහිපයක් (රතු පාට, නිල් පාට, කහ පාට)
  - සිසුන් එළිමහනට රැගෙන ගොස් බැලුන් බෝල බෙදා දී පුම්බන ලෙස කියන්න. අවශ්‍ය සිසුන්ට උදවු කරන්න.
  - තමන් අත තිබෙන බැලුන් බෝලවල වර්ණය අනුව කණ්ඩායම්වලට වෙන් වීමට සිසුන් මෙහෙය වන්න.

    උදාහරණ : රතු බැලුන් බෝල කණ්ඩායම, නිල් බැලුන් බෝල කණ්ඩායම, කහ බැලුන් බෝල කණ්ඩායම ලෙස සිසු කණ්ඩායම් නම් කරන්න.
  - කණ්ඩායම් තුනට ස්ථාන තුනක් වෙන් කර දෙන්න. ඉන්පසු මිදුලේ තැනින් තැන සිසුන් අත ඇති බැලුන් බෝල තබන්න.
  - සංඥාවක් නිකුත් කළ විට තම කණ්ඩායමට අයත් ස්ථානයෙන් තම කණ්ඩායමේ පාට බැලුන් බෝල ටික රැගෙන විත් තබන ලෙස උපදෙස් දෙන්න.
  - ක්‍රියාකාරකම සඳහා සිසුන් කිහිප වරක් යොමු කරමින් පාට අනුව නිවැරදි ව වෙන් කළා ද යන්න තහවුරු කර ගන්න.
  - නැවත වරක් බැලුන් බෝල මිදුලේ තැනින් තැන තබා සිසුන් කණ්ඩායම් අතර හුවමාරු කරමින් මෙය සිදු කරන්න.

ක්‍රියාකාරකම 3

- වර්ණය අනුව තේරීමට අදාළ ව කුඩා රූප කට්ටලය බැගින් කපා වෙන් කර සෑම සිසුවෙකුට ම දෙන්න.

උදා -



- වර්ණය අනුව තේරූ පසු ගොඩවලට වෙන් කර කඩදාසියක ඇලවීමට දෙන්න.
- නිවැරදි ව වෙන් කර අලවා ඇත්නම් සිසුන් අගය කරන්න. දුෂ්කරතා පෙන්වන සිසුන්ට සහාය වෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි "**ද්‍රව්‍ය තෝරමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 2 සඳහා සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 4

- සිසුන්ට වර්ණ තුනක ද්‍රව්‍ය කට්ටලයක් තේරීමෙන් පසු එම ද්‍රව්‍ය යොදා ගෙන ඔවුන් කැමති ආකාරයේ නිර්මාණයක් කිරීමට අවස්ථාව දෙන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.1 එක් වර්ණයකින් ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ හැඩය සහ තරම සමාන එකම වර්ගයේ ද්‍රව්‍ය සහිත වර්ණ තුනක ද්‍රව්‍ය කට්ටලයක් වර්ණය අනුව ගොඩවල් තුනකට වෙන් කරයි. | 2.1.1 | වර්ණය අනුව නිවැරදි ව ගොඩවල් තුනකට වෙන් කරයි. | වර්ණය අනුව ගොඩවල් තුනකට වෙන් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 2.2 හැඩය සහ තරම සමාන ද්‍රව්‍ය සහිත වර්ණ තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවල් තුනකට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 2.2.1 | ගොඩවල් තුනකට වෙන් කළ හේතුව නිවැරදි ව ප්‍රකාශ කරයි. | ගොඩවල් තුනකට වෙන් කළ හේතුව ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

සියලු ම සිසුන් ප්‍රවීණතාවට පැමිණිය යුතු අතර එසේ නොවන සිසුන්ට තව දුරටත් ක්‍රියාකාරකම් යොදා ගනිමින් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.

**හැඩය අනුව තේරීම**

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 3. හැඩ තුනක ද්‍රව්‍ය කට්ටලයක් වෙන් කළ ආකාරය විස්තර කරමින් හැඩය අනුව ගොඩවලට වෙන් කරයි. | ■ වර්ණය සහ තරම සමාන හැඩ තුනක ද්‍රව්‍ය කට්ටල හැඩය අනුව තේරීම | 3.1 එක් හැඩයකින් ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ වර්ණය සහ තරම සමාන, හැඩ තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවල් තුනකට වෙන් කරයි. | 3.1.1 නිවැරදි ව වෙන් කිරීම |
| | | 3.2 වර්ණය සහ තරම සමාන හැඩ තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 3.2.1 හේතුව නිවැරදි වීම |
| 4. ද්‍රව්‍ය ගැළපෙන අයුරින් තෝරා ගෙන විවිධ නිර්මාණ කරයි. | ■ ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණ | 4.1 තේරීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණ කරයි. | 4.1.1 ස්වයං නිර්මාණයක් වීම |

**වාංමාලාව :**

තේරීම වර්ග කිරීම හැඩය

**ඉගෙනුම් සම්පත්**

- විවිධ තරමේ සහ හැඩයේ (ඉවත දමන) ඇසුරුම් පෙට්ටි
- විවිධ හැඩයේ ඝනවස්තු
- වර්ණ කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

විවිධ හැඩයෙන් යුතු ද්‍රව්‍ය කට්ටල (ඇසුරුම් පෙට්ටි, ටින්, බෝල වැනි) භාවිතයෙන් හැඩය අනුව තේරීමේ ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොදවන්න.

**ක්‍රියාකාරකම 1**

- සිසුන් සමග එළිමහනට යන්න.
- සූදානම් කර ගත් විවිධ හැඩයෙන් යුතු ද්‍රව්‍ය මිදුලේ එක් ස්ථානයක තබන්න.
- මිදුලේ වෘත්ත කිහිපයක් අඳින්න. එසේ නොමැති නම් සකස් කර ගත් තරමක් විශාල වළලු කිහිපයක් තබන්න.
- පළමු ව සිසුන්ට නිදහසේ තමන් කැමති ආකාරයකට එම වෘත්ත තුළ ද්‍රව්‍ය වෙන් කර තැබීමට කියන්න.
- එසේ වෙන් කළ ආකාරයට හේතු ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- ඒවා නැවත එක ගොඩක තබන්න.
- ඉන් පසු වෘත්ත තුනක් ඇඳ එම වෘත්ත තුළ එකිනෙකට වෙනස් හැඩය බැගින් තබා, එක් එක් හැඩයට ගැළපෙන ද්‍රව්‍ය ඉහත ද්‍රව්‍ය ගොඩෙන් තෝරා තැබීමට උපදෙස් දෙන්න. (වරකට එක් සිසුවෙකු බැගින් යොමු කරන්න.)
- වෙන් කරන ලද ද්‍රව්‍ය පෙන්වමින් හැඩය අනුව තේරීම පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇසුරුම් පෙට්ටි, ටින්, බෝල, ඝනක ප්‍රමාණවත් පරිදි කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- එම ද්‍රව්‍ය හැඩය අනුව ගොඩවල් දෙකකට හෝ තුනකට හෝ වෙන් කිරීමට කියන්න. එසේ වෙන් කිරීමට හේතු විමසන්න.
- විවිධ හැඩයෙන් යුතු එම ද්‍රව්‍ය කට්ටල භාවිතයෙන් ආකෘති ගොඩනැඟීමට අවස්ථාව දෙන්න. එම ආකෘති නිර්මාණවල ඇති වෙනස්කම් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 3**

- හැඩය අනුව ද්‍රව්‍ය තේරීමේ හැකියාව තව දුරටත් තහවුරු කිරීම සඳහා එළිමහන් ක්‍රීඩාවක් සැලසුම් කර ගන්න.

  උදාහරණ :-
  - වට්ටි තුනක් සහ හැඩ තුනක කාඩ්පත් ප්‍රමාණවත් පරිදි සූදානම් කර ගෙන එළිමහනට යන්න.
  - වට්ටි තුන ස්ථාන තුනක තබන්න.
  - වට්ටි තුන තුළ ආදර්ශ හැඩ තුනක් තබන්න.
  - හැඩ සහිත කාඩ් පත් ඒ අසල කලවම් කර තබන්න.
  - හැඩ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කර වට්ටි තුන අසල පේළියට සිට ගැනීමට කියන්න.
  - ක්‍රීඩාවක් කිරීමට යන බව පවසා, ගුරුවරිය සංඥාවක් දුන් විට, එක් එක් සිසුවා හැඩ කට්ටටලයෙන් තම කණ්ඩායම අසල ඇති හැඩයට සමාන හැඩයක් තෝරා ගෙන පැමිණිය යුතු බව පැහැදිලි කරන්න.
  - එක් අයකු හැඩය තෝරා ගෙන පැමිණි පසු කණ්ඩායමේ ඊළග සිසුවා යා යුතු බව ද පැහැදිලි කරන්න. (මෙහි දී සිසුන් සංඛ්‍යාවට සමාන හැඩ  සංඛ්‍යාවක් තබන්න.)
  - නිවැරදි ව හැඩය තෝරා තම කණ්ඩායමේ වට්ටියට දමා ඇති කණ්ඩායම් අගය කරන්න.
  - කණ්ඩායම් මාරු කරමින් විනෝදජනක ව මෙම ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**ක්‍රියාකාරකම 4**

- හැඩය අනුව තේරීමට අදාළ හැඩ තුනක කට්ටලයක් සැම සිසුවෙකුට ම ලබා දෙන්න.

  උදාහරණ :-
  - පළමු ව සිසුන් කැමති ආකාරයට එම හැඩ ගොඩවලට වෙන් කිරීමට කියන්න.
  - හැඩය අනුව තෝරා නොමැති නම් ඒ සඳහා මග පෙන්වන්න.
  - හැඩය අනුව තේරූ පසු එම හැඩ ගොඩවලට වෙන් කර කඩදාසියක ඇලවීමට දෙන්න.

- ක්‍රියාකාරකම් පොතෙහි **"ද්‍රව්‍ය තෝරමු"** පාඩමෙහි **ක්‍රියාකාරකම** 3හි නිරත වීමට සිසුන් යොමු කරන්න.
- හැකි අවස්ථාවලදී තෝරා ගත් ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණ කිරීමට ද යොමු කරන්න.

  උදාහරණ:
  - වර්ණ කඩදාසියකින් කපා ගත් හැඩ කිහිපයක් හැඩය අනුව තේරීමෙන් පසු ඒවා ඇසුරෙන් නිර්මාණ කිරීම.
  - විවිධ හැඩයේ සහ තරමේ ඉවත ලන ඇසුරුම් පෙට්ටි ඇසුරෙන් ආකෘති ගොඩනැගීම.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.1 එක් හැඩයකින් ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ වර්ණය සහ තරම සමාන, හැඩ තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවල් තුනකට වෙන් කරයි. | 3.1.1 | හැඩය අනුව නිවැරදි ව ගොඩවල් තුනකට වෙන් කරයි. | හැඩය අනුව ගොඩවල් තුනකට වෙන් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 3.2 වර්ණය සහ තරම සමාන හැඩ තුනක ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 3.2.1 | ගොඩවල් තුනකට වෙන් කළ හේතුව නිවැරදි ව ප්‍රකාශ කරයි. | ගොඩවල් තුනකට වෙන් කළ හේතුව ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 4.1 තේරීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණ කරයි. | 4.1.1 | ස්වයං නිර්මාණයක් කරයි. | නිර්මාණයක් කිරීමට උනන්දුවක් නොදක්වයි. |

සියලු ම සිසුන් ප්‍රවීණතාවට පැමිණිය යුතු අතර එසේ නොවන සිසුන්ට තව දුරටත් ක්‍රියාකාරකම් යොදා ගනිමින් ඒ සඳහා අවස්ථාව ලබා දීම ගුරුවරයාගේ වගකීමයි.

**තරම අනුව තේරීම**

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 5. ද්‍රව්‍ය කට්ටලයක් වෙන් කළ ආකාරය විස්තර කරමින් තරම අනුව ගොඩවලට වෙන් කරයි. | ■ එක ම වර්ගයේ ද්‍රව්‍ය සහිත කට්ටල තරම අනුව තේරීම | 5.1 එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ තරම එකිනෙකට වෙනස් ද්‍රව්‍ය කට්ටලයක් තරම අනුව ගොඩවලට වෙන් කරයි. | 5.1.1 නිවැරදි ව වෙන් කිරීම |
| | | 5.2 තරම එකිනෙකට වෙනස් ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 5.2.1 හේතුව නිවැරදි වීම |

වාංමාලාව :

තේරීම  වර්ග කිරීම  තරම  ගොඩවලට වෙන් කිරීම

**ඉගෙනුම් සම්පත්**

- අවට පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය

    උදාහරණ :- ගස්වල කොළ,

- විවිධ තරමේ (ඉවත දමන) ඇසුරුම් පෙට්ටි
- විවිධ තරමේ සනවස්තු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පළමුවෙන් ම වර්ණය හා හැඩය එකිනෙකට සමාන තරම දෙකකින් යුත් එක ම වර්ගයේ ද්‍රව්‍ය කට්ටලයක් තරම අනුව ගොඩවලට වෙන් කිරීම හඳුන්වා දීමට සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න. ඉන් පසුව තරම අනුව ගොඩවල් තුනකට වෙන් කිරීමේ අවස්ථා යොදා ගන්න.

- ක්‍රියාකාරකම් පොතෙහි "**ද්‍රව්‍ය තෝරමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 4 සඳහා සිසුන් යොමු කරන්න.

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 5.1 එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනකට නොවැඩි සංඛ්‍යාවක් බැගින් වූ තරම එකිනෙකට වෙනස් ද්‍රව්‍ය කට්ටලයක් තරම අනුව ගොඩවලට වෙන් කරයි. | 5.1.1 | එකිනෙකට වෙනස් තරම තුනකින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් තරම අනුව ගොඩවල් තුනකට වෙන් කරයි. | තරම අනුව ගොඩවලට වෙන් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 5.2 තරම එකිනෙකට වෙනස් ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 5.2.1 | ගොඩවල් තුනකට වෙන් කළ හේතුව ප්‍රකාශ කරයි. | ගොඩවලට වෙන් කළ හේතුව ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

වයනය අනුව තේරීම

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 6. ද්‍රව්‍ය කට්ටලයක් වෙන් කළ ආකාරය විස්තර කරමින් වයනය අනුව ගොඩවලට වෙන් කරයි. | ▪ පරිසරයෙන් සපයා ගත් ද්‍රව්‍ය වයනය අනුව තේරීම | 6.1 සිනිඳු සහ ගොරෝසු ද්‍රව්‍ය දෙක බැගින් වූ ද්‍රව්‍ය කට්ටලයක ද්‍රව්‍ය වයනය අනුව ගොඩවල් දෙකකට වෙන් කරයි. | 6.1.1 නිවැරදි ව වෙන් කිරීම |
| | | 6.2 සිනිඳු සහ ගොරෝසු ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 6.2.1 හේතුව නිවැරදි වීම |

වාංමාලාව :

තේරීම　　වර්ග කිරීම　　සිනිඳු　　ගොරෝසු

**ඉගෙනුම් සම්පත්**

- අවට පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය
  
  උදාහරණ :- ගල් කැට, ගස්වල කොළ, මල්, ඇට වර්ග, රෙදි කැබලි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

වයනය (සිනිඳු සහ ගොරෝසු බව) අනුව ද්‍රව්‍ය තේරීමේ හැකියාව සිසුන් තුළ සංවර්ධනය කිරීම සඳහා පහත ආකාරයේ ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න. සිනිඳු සහ ගොරෝසු බව හඳුනා ගැනීම සඳහා සිසුන්ට ද්‍රව්‍ය ස්පර්ශ කර බැලීමට දීම අනිවාර්ය වේ.

- සිසුන් හතර දෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- සිනිඳු සහ ගොරෝසු ද්‍රව්‍ය කට්ටලයක් සපයා ගන්න.
  උදා :- බොරළු, ගල් කැට, සිප්පි කටු, පුළුන් කැබලි, කුරුලු පිහාටු කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ඒවා අතට ගෙන ස්පර්ශ කර බැලීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- අතට ගෙන ස්පර්ශ කර බැලීමේදී දැනෙන දේ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- "සිනිඳුයි", "ගොරෝසුයි" වැනි අදහස් සිසුන් කෙරෙන් මතු වන අයුරින් සාකච්ඡා කරන්න.
- සිනිඳු දේ සහ ගොරෝසු දේ වෙන් කර මේසය උඩ තැබීමට උපදෙස් දෙන්න.
- ගුරු මේසය මත වට්ටි දෙකක් තබන්න.
- කණ්ඩායමේ සිසුන් හතර දෙනාට තම මේසය මත ඇති ද්‍රව්‍ය එක් අයකු එකක් බැගින් නැවත අතට ගන්නා ලෙස පවසන්න.
- ගුරු මේසය මත ඇති වට්ටි දෙක පෙන්වා එකකට සිනිඳු ද්‍රව්‍ය ද අනෙක් වට්ටියට ගොරෝසු ද්‍රව්‍ය ද දැමිය යුතු බව කියන්න.
- එක් එක් සිසුවාට ඉදිරියට පැමිණ තම අතේ තිබෙන ද්‍රව්‍යය සිනිඳු ද ගොරෝසු ද යන්න හඳුනා ගෙන නිවැරදි වට්ටියට දාන්න යැයි පවසන්න.
- සිසුන් වයනය අනුව ද්‍රව්‍ය තේරීම නිවැරදි ව සිදු කරන්නේ ද යන්න තහවුරු කර ගන්න.
- තෝරන ලද ආකාරය විස්තර කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 6.1 සිනිඳු සහ ගොරෝසු ද්‍රව්‍ය දෙක බැගින් වූ ද්‍රව්‍ය කට්ටලයක ද්‍රව්‍ය වයනය අනුව ගොඩවල් දෙකකට වෙන් කරයි. | 6.1.1 | වයනය අනුව නිවැරදි ව ගොඩවල් දෙකකට වෙන් කරයි. | වයනය අනුව ගොඩවලට වෙන් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 6.2 සිනිඳු සහ ගොරෝසු ද්‍රව්‍ය කට්ටලයක් ගොඩවලට වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි. | 6.2.1 | ගොඩවල් දෙකකට වෙන් කළ හේතුව නිවැරදි ව ප්‍රකාශ කරයි. | ගොඩවලට වෙන් කළ හේතුව ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

- **ද්‍රව්‍ය ඇසුරෙන් ක්‍රියාකාරකම් කිරීමෙන් සිසුන් තුළ අදාළ සංකල්පය තහවුරු වූ පසු පමණක් ක්‍රියාකාරකම් පොත භාවිත කරන්න.**
- **සියලු ම සිසුන් අදාළ ප්‍රවීණතාවට පැමිණිය යුතු අතර එසේ නොවන සිසුන්ට තව දුරටත් ක්‍රියාකාරකම් යොදා ගනිමින් ඒ සඳහා අවස්ථාව ලබා දීම ගුරුවරයාගේ වගකීමයි.**

# 2 පූර්ව ගණිත සංකල්ප - සැසඳීම

මෙම සංකල්පය යටතේ ද්‍රව්‍ය හෝ ද්‍රව හෝ ප්‍රමාණ දෙකක් තරම හා ප්‍රමාණය අනුව සැසඳීමේ හැකියාව සිසුන් තුළ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. මෙහිදී ඝන වස්තු තරම අනුව සමාන, ලොකු සහ කුඩා වශයෙන් ද ද්‍රව ප්‍රමාණය අනුව සමාන, වැඩි සහ අඩු ලෙස ද සැසඳීම සිදු කළ යුතු ය. ක්‍රියාකාරකම් ආරම්භයට පෙර මෙම සංකල්පය යටතේ සඳහන් ඉගෙනුම් පල, කාර්ය සාධන ප්‍රමිති සහ විෂය අන්තර්ගතය පිළිබඳ අවධානය යොමු කරන්න.

තරම අනුව සැසඳීම

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. එකම වර්ගයේ වස්තු දෙකක් තරම අනුව සන්සන්දනය කරයි. | ■ එක ම වර්ගයේ වස්තු ලොකු, කුඩා, සමාන ලෙස සන්සන්දනය | 1.1 තරම වෙනස් එක ම වර්ගයේ වස්තු දෙකක් ලොකු සහ කුඩා ලෙස සන්සන්දනය කරයි. | 1.1.1 සැසඳීම නිවැරදි වීම |
| | | 1.2 එක ම තරමේ වස්තු දෙකක් සන්සන්දනය කර තරම සමාන බව ප්‍රකාශ කරයි. | 1.2.1 නිවැරදි වීම |
| 2. එකිනෙක වෙනස් වර්ගයේ වස්තු දෙකක් තරම අනුව සන්සන්දනය කරයි. | ■ එකිනෙක වෙනස් වර්ගයේ වස්තු දෙකක් ලොකු, කුඩා ලෙස සන්සන්දනය | 2.1 වෙනස් වර්ගයේ වස්තු දෙකක් ලොකු සහ කුඩා ලෙස සන්සන්දනය කරයි. | 2.1.1 සැසඳීම නිවැරදි වීම |
| 3. පරිසරයේ දක්නට ලැබෙන වස්තු තරම අනුව සන්සන්දනයට යොමු වෙයි. | ■ පරිසරයේ දක්නට ලැබෙන වස්තු සන්සන්දනය | 3.1 පරිසරයේ දක්නට ලැබෙන වස්තු ලොකු සහ කුඩා වශයෙන් සන්සන්දනය කරයි. | 3.1.1 සැසඳීම නිවැරදි වීම |

වාංමාලාව :

ලොකු/ විශාල　　පොඩි/ කුඩා　　තරම සමාන　　තරම වෙනස්

**ඉගෙනුම් සම්පත්**

- අවට පරිසරයෙන් සපයා ගත හැකි තරම වෙනස් විවිධ වස්තු/ විවිධ ද්‍රව්‍ය
- එක ම තරමේ විවිධ වස්තු
- ජලය
- ආකෘති සෑදීම සඳහා මැටි හෝ ක්ලේ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සැසඳීම යටතේ වරකට වස්තු දෙකක් බැගින් තරම අනුව ලොකු, කුඩා සහ සමාන ලෙස සැසඳීමේ අවස්ථාව සිසුන්ට ලබා දිය යුතු ය.
- මේ සඳහා පළමු ව සිසුන්ට නිදහසේ වස්තු සැසඳීමට අවස්ථාව දෙන්න. ඒවායේ වෙනස විමසන්න.
- මෙහිදී එදිනෙදා කාර්යයන්ට සම්බන්ධ කර ගනිමින් ලොකු සහ කුඩා වස්තු හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ: ගුරුතුමා/ ගුරුතුමියගේ මේසය/ පුටුව සහ සිසුන්ගේ මේස/ පුටු

- පන්ති කාමරයේ සහ අවට පරිසරයේ තිබෙන වස්තු නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.
- මෙහිදී තරම සමාන වස්තු ද හඳුනා ගැනීමට යොමු කළ යුතු ය.
- මැටි හෝ ක්ලේ හෝ ලබා දී සිසුන් දෙදෙනා බැගින් එකතු වී සිසුන් කැමති ආකාරයකට ලොකු සහ කුඩා නිර්මාණ දෙකක් කිරීමට යොමු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි **"තරම අනුව සසඳමු"** පාඩමෙහි ක්‍රියාකාරකම් කිරීමට යොමු කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 තරම වෙනස් එක ම වර්ගයේ වස්තු දෙකක් ලොකු සහ කුඩා ලෙස සන්සන්දනය කරයි. | 1.1.1 | එක ම වර්ගයේ වස්තු දෙකක් සන්සන්දනය කර ලොකු සහ කුඩා වස්තුව වෙන් කර දක්වයි. | එක ම වර්ගයේ වස්තු දෙකක් සන්සන්දනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 1.2 එක ම තරමේ වස්තු දෙකක් සන්සන්දනය කර තරම සමාන බව ප්‍රකාශ කරයි. | 1.2.1 | තරම සමාන එක ම වර්ගයේ වස්තු දෙකක තරම සමාන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | තරම සමාන එක ම වර්ගයේ වස්තු දෙකක තරම සමාන බව හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.1 වෙනස් වර්ගයේ වස්තු දෙකක් ලොකු සහ කුඩා ලෙස සන්සන්දනය කරයි. | 2.1.1 | වෙනස් වර්ගයේ වස්තු දෙකක් සන්සන්දනය කර ලොකු සහ කුඩා වස්තුව වෙන් කර දක්වයි. | වෙනස් වර්ගයේ වස්තු දෙකක් සන්සන්දනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |

- අදාළ ප්‍රවීණතාවට නොපැමිණි සිසුන් සඳහා උදාහරණ වශයෙන් ගත හැකි එදිනෙදා කාර්යයන් ක්‍රියාකාරකම් ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කරන්න.

දුව ප්‍රමාණ සැසඳීම

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 4. විනිවිද පෙනෙන භාජනවල ඇති දුව ප්‍රමාණ සන්සන්දනය කරයි. | ■ එක ම හැඩයේ, තරම සමාන භාජන දෙකක දුව ප්‍රමාණ අඩු, වැඩි සහ සමාන ලෙස සන්සන්දනය | 4.1. එක ම හැඩයේ තරම සමාන විනිවිද පෙනෙන භාජන දෙකක ඇති දුව ප්‍රමාණ එකිනෙක සන්සන්දනය කරයි. | 4.1.1 සැසඳීම නිවැරදි වීම |

වාංමාලාව :

අඩු වැඩි ප්‍රමාණය අඩුවෙන් වැඩියෙන්

**ඉගෙනුම් සම්පත්**

- ජලය (වර්ණ ගන්වන ලද ජලය වඩාත් සුදුසු ය)
- එක ම හැඩයේ එක ම තරමේ විනිවිද පෙනෙන භාජන (වීදුරු/ ප්ලාස්ටික් බෝතල්) දෙක බැගින් කට්ටල කිහිපයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- දුව ප්‍රමාණ දෙකක් සැසඳීම සඳහා හැඩය හා තරම සමාන විනිවිද පෙනෙන භාජන දෙකක් සහ පාට කළ ජලය යොදා ගන්න.

  උදාහරණ:

  විනිවිද පෙනෙන භාජන දෙකකට පාට කර ගත් ජලය දමමින් ජල ප්‍රමාණ අඩු/ වැඩි හෝ සමාන ලෙස සැසඳීම සිදු කරන්න.
- දුව ප්‍රමාණ සැසඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න. මේ සඳහා,
  - සිසුන් කණ්ඩායම් කරන්න.
  - එක් එක් කණ්ඩායමට ජලය පිරවිය යුතු මට්ටම (වෙනස් ව හා සමාන වන ලෙස ද) සලකුණු කරන ලද එක ම තරමේ එක ම හැඩයේ විනිවිද පෙනෙන භාජනයක්, පාට කර ගත් ජලය සහිත බේසමක්, පුනීලයක් සහ ජලය භාජනවලට දැමීමට යෝගට් කෝප්පයක් වැනි කුඩා භාජනයක් ලබා දෙන්න.
  - භාජනවලට සලකුණු කරන ලද මට්ටමට ජලය දැමූ පසු අනෙක් කණ්ඩායම් සමඟ ජල මට්ටම සැසඳීමට යොමු කරන්න.
- අවශ්‍ය නම් කණ්ඩායම්වලට ඉහත ආකාරයට සලකුණු කරන ලද භාජන දෙක බැගින් ලබා දී ජල ප්‍රමාණ සැසඳීමට අවස්ථාව දෙන්න. (ජල ප්‍රමාණය අඩු, වැඩි සහ සමාන අවස්ථා පෙනෙන ලෙස සලකුණු යෙදීමට ගුරුවරයා වගබලා ගන්න.)
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වලදී ලද අත්දැකීම් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- දුව ප්‍රමාණ සැසඳීමෙන් අඩු, වැඩි, සමාන බව හඳුනා ගත් පසු ක්‍රියාකාරකම් පොතේ "**සමාන, අඩු සහ වැඩි ලෙස සසඳමු**" පාඩමෙහි ක්‍රියාකාරකම් සඳහා යොමු කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 4.1 එක ම හැඩයේ තරම සමාන විනිවිද පෙනෙන භාජන දෙකක ඇති ද්‍රව ප්‍රමාණ එකිනෙක සන්සන්දනය කරයි. | 4.1.1 | ද්‍රව ප්‍රමාණ එකිනෙක සන්සන්දනය කර අඩු, වැඩි සහ සමාන බව ප්‍රකාශ කරයි. | ද්‍රව ප්‍රමාණ එකිනෙක සන්සන්දනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |

- අදාළ ප්‍රවීණතාවට නොපැමිණි සිසුන් සඳහා උදාහරණ වශයෙන් ගත හැකි එදිනෙදා කාර්යයන් ක්‍රියාකාරකම් ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කරන්න.

# 3 පූර්ව ගණිත සංකල්ප - එකට එක අනුරූපතාව

මෙහිදී කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය (අවයව) එකිනෙක සීහුම් කිරීම සිදු කළ යුතු අතර කට්ටලවල ඇති ද්‍රව්‍ය ප්‍රමාණ ගණන් කිරීම අවශ්‍ය නො වේ. එකට එක අනුරූපතාවේදී පළමුවෙන් ම නිතැතින් ම ගැළපෙන කට්ටල දෙකක් තෝරා ගත යුතු ය. ඉන් පසුව නිතැතින් ම නොගැළපෙන කට්ටල දෙකක් තෝරා ගත යුතු ය.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. එකිනෙකට ගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපයි. | ▪ එකිනෙකට ගැළපෙන, සමාන ප්‍රමාණ සහිත ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූපතාව මත ගැළපීම | 1.1 එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත එකිනෙකට ගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස ගළපයි. | 1.1.1 ගැළපීම නිවැරදි වීම |
| 2. එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපයි. | ▪ එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූපතාව මත ගැළපීම | 2.1 එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස ගළපයි. | 2.1.1 ගැළපීම නිවැරදි වීම |
| 3. ද්‍රව්‍ය කට්ටල එකට එක අනුරූප ව ගැළපීම මගින් ද්‍රව්‍ය ප්‍රමාණ සමාන, අඩු, වැඩි බව හඳුනා ගනියි. | ▪ ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූපතාව මත ගළපා ද්‍රව්‍ය සමාන, අඩු සහ වැඩි ලෙස සන්සන්දනය | 3.1. එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපා කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍ය සමාන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 හඳුනා ගැනීම නිවැරදි වීම |
| | | 3.2. එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත, අසමාන ප්‍රමාණවලින් යුත් ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපා කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍යවල අඩු, වැඩි බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.2.1 ගැළපීම නිවැරදි වීම |

වාංමාලාව :

එකට එක සමාන අඩු වැඩි

**ඉගෙනුම් සම්පත්**

- නිතැතින් ම එකට එක ගැළපෙන ද්‍රව්‍ය කට්ටල (උදාː ඉවත ලන යෝගට් කෝප්ප හා හැඳි, ඉවතලන බෝතල් හා මූඩි)
- ඉරටු/කෝටු
- එකට එක ගැළපීම සඳහා නිතැතින් ම නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල (මේ සඳහා පන්ති කාමරයේ ඇති දේ ද යොදා ගත හැකි ය.)
  උදාː පැන්සල්, පෑන්, ගල් කැට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම** 1

- කතන්දරයක් ඇසුරෙන් හෝ නිවසේ සිදු විය හැකි සිද්ධියක් ඇසුරෙන් ද්‍රව්‍ය යොදා ගෙන එකට එක අනුරූපතාව හඳුන්වා දීමට ප්‍රවේශයක් ලබා ගන්න.
  උදාහරණයː
  යෝගට් කෑම සඳහා එක යෝගට් කෝප්පයකට එක හැන්ද බැගින් අවශ්‍ය වන බව මතක් කරන්න.
- යෝගට් කෝප්ප සහ හැඳි සමාන ප්‍රමාණවලින් සිසු කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- තමන්ට ලැබුණු යෝගට් කෝප්ප ගණනට සමාන ව හැඳි තිබේ දැයි බලන ලෙස සිසු කණ්ඩායම්වලට කියන්න.
- එක් එක් කණ්ඩායම් අසලට ගොස් නිරීක්ෂණය සහ ප්‍රශ්න ඇසීම සිදු කරන්න..
  - යෝගට් කෝප්ප සහ හැඳි වෙන වෙන ම ගණන් කරන්නේ ද?
  - එක ළඟ තබා සැසඳීමෙන් හඳුනා ගන්නේ ද? යන්න පිළිබඳ විමසිලිමත් වන්න.
- ක්‍රියාකාරකම සිදු කළ ආකාරය ප්‍රකාශ කිරීමට හෝ නැවත එය කර පෙන්වීමට සිසු කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- තව දුරටත් තහවුරු කිරීම සඳහා පහත උපදෙස් ලබා දෙන්න,
  යෝගට් කෝප්ප පේළියට තබන්න. ඊට ඉදිරියෙන් යෝගට් හැඳි එක පෙළට තබන්න.
  ඉන්පසු සෑම යෝගට් කෝප්පයකට ම හැන්දක් හා සෑම හැන්දකට ම යෝගට් කෝප්පයක් තිබෙනවා දැයි බැලීමට ඉරටුව බැගින් තබා සීහුම් කිරීමට යොමු කරන්න.
- වෙනත් ද්‍රව්‍ය කට්ටල ලබා දී තව දුරටත් ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ඇති "**එකකට එකක් ගළපමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 1 සඳහා සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම** 2

- නිතැතින් ම එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක් එකිනෙකට ගළපා එකට එක අනුරූපතාව පිළිබඳ අවබෝධය තවදුරටත් තහවුරු වීමට සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.
  උදාහරණයː මේසය සහ පොත
- මෙහිදී කට්ටල දෙකෙහි ද්‍රව්‍ය සමාන අවස්ථා යොදා ගන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි "**එකකට එකක් ගළපමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 2 සඳහා සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම** 3

- නිතැතින් ම එකිනෙකට ගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක් ගන්න. එහි එක කට්ටලයකට අනෙකට වඩා එක ද්‍රව්‍යයක් අඩුවෙන් ගන්න. සිසුන්ට එකිනෙකට ගැළපීමට අවස්ථාව දෙන්න. එමගින් එක් කට්ටලයක අනෙකට වඩා ද්‍රව්‍ය එකක් අඩුවෙන්/ වැඩියෙන් ඇති බව හඳුනා ගැනීමට යොමු කරන්න.
- විවිධ ද්‍රව්‍ය කට්ටල ඇසුරෙන් ක්‍රියාකාරකම්හි නිරත කරවමින් එය තවදුරටත් තහවුරු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි "**එකකට එකක් ගළපමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 3 සඳහා සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 4

- නිතැතින් ම එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක් ගන්න. එහි එක කට්ටලයකට අනෙකට වඩා එක ද්‍රව්‍යයක් අඩුවෙන් ගන්න සිසුන්ට එකිනෙකට ගැළපීමට අවස්ථාව දෙන්න. එමගින් එක් කට්ටලයක අනෙකට වඩා ද්‍රව්‍ය එකක් අඩුවෙන්/ වැඩියෙන් ඇති බව හඳුනා ගැනීමට යොමු කරන්න.
- විවිධ ද්‍රව්‍ය කට්ටල ඇසුරෙන් ක්‍රියාකාරකම්හි නිරත කරවමින් එය තව දුරටත් තහවුරු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි **"එකකට එකක් ගළපමු"** පාඩමෙහි **ක්‍රියාකාරකම 4 සහ 5** සඳහා සිසුන් යොමු කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 1.1 එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත එකිනෙකට ගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස ගළපයි. | 1.1.1 | එකිනෙකට ගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස සීහුම් කරමින් නිවැරදි ව ගළපයි. | එකිනෙකට ගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස සීහුම් කරමින් සුළු අඩුපාඩු සහිත ව ගළපයි. | අන් අයගේ උදවු ඇති ව ද්‍රව්‍ය එකට එකක් වන ලෙස සීහුම් කරමින් ගළපයි. | කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස ගැළපීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.1 එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස ගළපයි. | 2.1.1 | එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස සීහුම් කරමින් නිවැරදි ව ගළපයි. | එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස සීහුම් කරමින් සුළු අඩුපාඩු සහිත ව ගළපයි. | අන් අයගේ උදවු ඇති ව ද්‍රව්‍ය එකට එකක් වන ලෙස සීහුම් කරමින් ගළපයි. | කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එකක් වන ලෙස ගැළපීමේ දුෂ්කරතා පෙන්වයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.1 එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත ද්‍රව්‍ය කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපා කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍ය සමාන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 | කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපා ද්‍රව්‍ය ප්‍රමාණ සමාන බව ප්‍රකාශ කරයි. | කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපයි. ද්‍රව්‍ය ප්‍රමාණ සමාන බව ප්‍රකාශ නො කරයි. | අන් අයගේ උදවු ඇති ව ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපා ද්‍රව්‍ය ප්‍රමාණ සමාන බව ප්‍රකාශ කරයි. | කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගැළපීම හෝ සමාන බව හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 3.2 එක් කට්ටලයක ද්‍රව්‍ය පහකට නොවැඩි සංඛ්‍යාවක් සහිත, අසමාන ප්‍රමාණවලින් යුත් ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපා කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍යවල අඩු, වැඩි බව හඳුනා ගනියි. | 3.2.1 | අසමාන ප්‍රමාණවලින් යුත් ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක අනුරූප ව ගළපා කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍යවල අඩු, වැඩි බව නිවැරදි ව ප්‍රකාශ කරයි. | කට්ටල දෙකක ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපයි. ද්‍රව්‍ය ප්‍රමාණවල අඩු වැඩි බව ප්‍රකාශ නොකරයි. | අන් අයගේ උදවු ඇති ව කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගළපා ද්‍රව්‍යවල අඩු, වැඩි බව ප්‍රකාශ කරයි. | කට්ටල දෙකෙහි ඇති ද්‍රව්‍ය එකට එක අනුරූප ව ගැළපීම හෝ අඩු, වැඩි බව හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්වයි. |

- සිසුන් තනි තනි ව හෝ කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යෙදෙන විට හෝ නිරීක්ෂණය මගින් ඉහත නිර්ණායක යටතේ අදාළ හැකියාව අත්පත් කර ගෙන ඇති ද යන්න තහවුරු කර ගන්න

# 4 පූර්ව ගණිත සංකල්ප - අසර

අසර (සාපේක්ෂ පිහිටීම) ලෙස හඳුන්වන්නේ යම් වස්තුවකට හෝ පුද්ගලයෙකුට හෝ සාපේක්ෂ ව තවත් වස්තුවක හෝ පුද්ගලයෙකුගේ පිහිටීම යි. මෙම සාපේක්ෂ පිහිටීම විස්තර කිරීමට යොදා ගන්නා වාංමාලාව නිවැරදි ව භාවිත කිරීමේ හැකියාව සිසුන් තුළ සංවර්ධනය විය යුතු ය.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. වස්තු තුනක පිහිටීම එකිනෙකට සාපේක්ෂ ව විස්තර කරයි. | ▪ එකිනෙකෙට සාපේක්ෂ ව වස්තු තුනක පිහිටීම<br>▪ ඉදිරියෙන්, මැදින්, පිටුපසින් යන වචන භාවිතය | 1.1 එක ම දිශාවකට යොමුව එක පේළියකට පිහිටි වස්තු තුනක පිහිටීම එකිනෙකට සාපේක්ෂ ව විස්තර කරයි. | 1.1.1 විස්තරය නිවැරදි වීම |

වාංමාලාව :

ඉදිරියෙන් මැදින් පිටුපසින්

**ඉගෙනුම් සම්පත්**
- එකිනෙක පිටුපසින් යන ආකාරයට තැබිය හැකි වාහන සහ සතුන්ගේ ආකෘති සහ රූප

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**
**ක්‍රියාකාරකම 1**
- සතුන් තිදෙනෙකුගේ ආකෘති යොදා ගනිමින් කතන්දරයක ආකාරයට සාපේක්ෂ පිහිටීම හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.

උදාහරණය:
කැලෑ ගමේ හිටපු සතුන් තුන්දෙනෙක් දවසක් දිවීමේ තරගයක් තිබ්බා. මෙයාලා දුවන දිහා කැලේ සතුන් ඇසිපිය නොහෙලා බලා හිටියා ඔහොම යනකොට කැලේ බෙලි ගහ යට ඉඳ ගෙන මේ තරගය බලා ගෙන හිටපු නරි රාල මේ දුවන අයව දැක්කා. ඔයාලා දන්නව ද ඒ වෙලාවෙ කොහොම ද මේ සත්තු හිටියෙ කියලා. මෙසේ අසමින් ඔබ තෝරා ගත් සත්ත්ව ආකෘති මේසය මත එක ම දිශාවකට යොමු වන ලෙස එකිනෙකට පිටුපසින් සිටින ලෙස තබන්න. සිසුන්ට දැක ගැනීමට සලස්වන්න. පහත ආකාරයේ ප්‍රශ්න අසමින් (සාපේක්ෂ) පිහිටීම ගැන සාකච්ඡා කරන්න.

- …………..ට ඉදිරියෙන් ඉන්නේ කවුද?
- …………..ට පිටුපසින් ඉන්නේ කවුද?
- මැදින් ඉන්නේ කවුද?

- කතන්දරය මගින් ම සත්ත්ව ආකෘතිවල පිහිටීම වෙනස් කරමින් ඉහත ආකාරයේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න.
- සිසුන් කණ්ඩායම් කර සත්ත්ව ආකෘති තුන බැගින් එක් එක් කණ්ඩායමට ලබා දෙන්න. ඒවා එක ම දිශාවකට යොමු වන ලෙස තබන්න යැයි පවසන්න. තබා ඇති පිළිවෙළ පිළිබඳ පන්තියේ අනෙක් සිසුන්ට විස්තර කිරීමට සෑම කණ්ඩායමකට ම අවස්ථාව දෙන්න. හැකි නම් කතන්දරයක් ආකාරයට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- සෑම සිසුවෙකුට ම (සාපේක්ෂ) පිහිටීම විස්තර කිරීමට අවස්ථාව ලැබෙන පරිදි ප්‍රශ්න අසන්න.
- තම කණ්ඩායමේ ඉදිරිපත් කිරීම චිත්‍රයට නැගීමට අවස්ථාව ලබා දෙන්න.
- අඳින ලද චිත්‍ර ප්‍රදර්ශනය කරන්න.

ක්‍රියාකාරකම 2

- අසර සංකල්පය සිසුන් තුළ තව දුරටත් තහවුරු කිරීම සඳහා සිසුන් සමග එළිමහනේ සිදු කළ හැකි ක්‍රියාකාරකමක් සැලසුම් කර ගන්න.

  උදා:
  - සතුන් හෝ වාහන හෝ අනුකරණය කරමින් ගමන් කිරීම
  - ඒදණ්ඩක ගමන් කරන ආකාරය අනුකරණය කිරීම
- මෙහිදී ද සෑම සිසුවෙකුට ම පිළිතුරු දීමට අවස්ථාව ලැබෙන පරිදි ප්‍රශ්න අසන්න.

ක්‍රියාකාරකම 3

- එක ම දිශාවකට යොමු වන සේ එකිනෙක පිටුපසින් ඇති රූප (සත්තු හෝ වාහන හෝ පුද්ගලයින්) ඇසුරෙන් සාපේක්ෂ පිහිටීම හඳුන්වා දීමට සුදුසු ක්‍රියාකාරකමක් සැලසුම් කර ගන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ "**පේළියට යමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම්** කිරීමට අවස්ථාව දෙන්න. ඒ ඇසුරෙන් නැවත ප්‍රශ්න අසන්න.

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 1.1 එක ම දිශාවකට යොමුව එක පේළියකට පිහිටි වස්තු තුනක පිහිටීම එකිනෙකට සාපේක්ෂ ව විස්තර කරයි. | 1.1.1 | ඉදිරියෙන්, මැදින් සහ පිටුපසින් පිහිටි වස්තු නිවැරදි ව නම් කරයි. | ඉදිරියෙන්, මැදින් සහ පිටුපසින් පිහිටි වස්තුවලින් දෙකක් පමණක් නිවැරදි ව නම් කරයි. | අන් අයගේ උදවු ඇති ව ඉදිරියෙන්, මැදින් සහ පිටුපසින් පිහිටි වස්තු නම් කරයි. | ඉදිරියෙන්, මැදින් සහ පිටුපසින් පිහිටි වස්තු නම් කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |

- සිසුන් ව තනි තනි ව තක්සේරු කිරීම සිදු කළ යුතු අතර, මේ සඳහා ක්‍රියාකාරකම් පොත ද යොදා ගත හැකි ය. සියලු ම සිසුන් ප්‍රවීණතා මට්ටමට රැගෙන ඒම සඳහා තව දුරටත් ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත.

# 5 පූර්ව ගණිත සංකල්ප - පටිපාටිගත කිරීම

මෙහිදී ද්‍රව්‍ය/ වස්තු තුනක් කුඩා ද්‍රව්‍යයේ/වස්තුවේ සිට විශාල ම ද්‍රව්‍ය/වස්තුව තෙක් අනුපිළිවෙළින් තැබීම (ආරෝහණ) සහ විශාල ද්‍රව්‍යයේ/වස්තුවේ සිට කුඩා ම ද්‍රව්‍ය/වස්තුව තෙක් අනුපිළිවෙළින් තැබීම (අවරෝහණ) යන සංකල්ප දෙක ම සිසුන් තුළ සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. ද්‍රව්‍ය පටිපාටිගත කිරීමට පෙර සිසුන් තුළ තරම අනුව ද්‍රව්‍ය සැසඳීමේ හැකියාව සංවර්ධනය වී තිබිය යුතු ය. එනම් ද්‍රව්‍ය දෙක බැගින් සසඳමින් තරම අනුව වෙන් කර හඳුනා ගැනීමට හැකි විය යුතු ය.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. තරම අනුව පටිපාටිගත කිරීම සඳහා ද්‍රව්‍ය සන්සන්දනය කරයි. | ■ එක ම හැඩයේ, එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනක් තරම අනුව සැසඳීම<br>■ ලොකු/විශාල, ලොකු ම/විශාල ම, කුඩා, කුඩා ම වචන භාවිතය | 1.1 එක ම හැඩයේ,එක ම වර්ගයේ, ද්‍රව්‍ය තුනක් නිවැරදි වචන භාවිත කරමින් තරම අනුව එකිනෙක සමග සන්සන්දනය කරයි. | 1.1.1 සැසඳීම නිවැරදි වීම<br><br>1.1.2 වාංමාලාව නිවැරදි වීම |
| 2. විවිධ ද්‍රව්‍ය තරම අනුව පටිපාටියට (අනුපිළිවෙළට) සකසයි. | ■ සමාන හැඩයෙන් යුක්ත එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනක් තරම අනුව පටිපාටිගත කිරීම | 2.1 සමාන හැඩයෙන් යුක්ත එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනක් පටිපාටියට (අනුපිළිවෙළට) තබයි. | 2.1.1 පටිපාටිය නිවැරදි වීම |
| 3. තරම අනුව ද්‍රව්‍ය අනුපිළිවෙළට තබා ඇති ස්ථාන පිළිබඳ සොයා බලයි. | ■ ද්‍රව්‍ය අනුපිළිවෙළට තබා ඇති ස්ථාන | 3.1 එක ම වර්ගයේ ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තබා ඇති ස්ථාන ප්‍රකාශ කරයි. | 3.1.1 ස්ථාන හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| 4. විවිධ අවස්ථාවල දී ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තැබීමට පෙලඹෙයි. | ■ ද්‍රව්‍ය අනුපිළිවෙළට තැබීම | 4.1 අවස්ථානුකූල ව විවිධ වර්ගයේ ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තබයි. | 4.1.1 අනුපිළිවෙළ නිවැරදි වීම |

වාංමාලාව :

කුඩා    කුඩා ම    විශාල    විශාල ම    තරමක් විශාල    තරමක් කුඩා

**ඉගෙනුම් සම්පත්**

- තරම එකිනෙකට වෙනස් හැඩය සමාන එක ම වර්ගයේ ද්‍රව්‍ය තුන බැගින් වූ කට්ටල කිහිපයක් (පෙට්ටි, හැඩතල)
- ඉවත ලන ද්‍රව්‍යවලින් සකසා ගත් (තරම එකිනෙකට වෙනස්) හැඩතල සහ විවිධ ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම** 1

- ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ ක්‍රියාකාරකම් ඇසුරෙන් විවිධ ද්‍රව්‍යවල තරම සැසඳීමට අවස්ථාව දෙන්න.

  උදාහරණය : පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි ''ශාක හා ආහාර බෝග'' තේමාවෙහි ගෙවත්ත නැරඹීමේදී තරම එකිනෙකට වෙනස් ගෙඩි වර්ග සැසඳීමට අවස්ථාව දිය හැකි ය. ගෙවත්තෙහි ඇති එක ම වර්ගයක ලොකු ම, ඊට ටිකක් කුඩා සහ කුඩා ම ගෙඩි හඳුනා ගැනීමට යොමු කරන්න. (තරම පිළිබඳ සිසුන් සමග කතා බහ කරන්න) ගෙවත්තෙහි වීඩියෝ දර්ශනයක් වුව ද යොදා ගත හැකි ය.

- සිසුන් සන්සන්දනය කරන ලද ලොකු ම, ඊට ටිකක් කුඩා සහ කුඩා ම ද්‍රව්‍ය (කැමති පරිදි) චිත්‍රයට නඟා පාට කිරීමට අවස්ථාව දෙන්න.
- අඳින ලද චිත්‍ර ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ "**තරම අනුව අනුපිළිවෙළට තබමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම 1 සහ** 2 සිදු කිරීමට අවස්ථාව දෙන්න. ඒ ඇසුරෙන් නැවත ප්‍රශ්න අසන්න.

**ක්‍රියාකාරකම** 2

- කතන්දරයක් හෝ යම් සිද්ධියක් හෝ මගින් එක ම වර්ගයේ තරම එකිනෙකට වෙනස් ද්‍රව්‍ය තුනක් සහිත කට්ටල කිහිපයකින් කුඩා ම, ටිකක් ලොකු (විශාල), ලොකු ම (විශාල ම) ද්‍රව්‍යය වෙන් වෙන් ව හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.
- සිසු කණ්ඩායම්වලට එවැනි ද්‍රව්‍ය කට්ටලය බැගින් ලබා දෙන්න. ඉහත අයුරින් ද්‍රව්‍ය වෙන් කර හඳුනා ගෙන ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එම ද්‍රව්‍ය සිසුන් කැමති ආකාරයකට අනුපිළිවෙළට තැබීමට කියන්න. ඔවුන් එසේ තැබීමට හේතුව විමසන්න.
- ද්‍රව්‍ය අනුපිළිවෙළට තබා ඇති අයුරු නිරීක්ෂණය කරමින් කුඩා ම ද්‍රව්‍යයේ සිට විශාල ම ද්‍රව්‍යය තෙක් අනුපිළිවෙළට තැබීමට කියන්න.
- ඒවා තබා ඇති පිළිවෙළ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම** 3

- විවිධ ද්‍රව්‍ය සහ අවස්ථා යොදා ගනිමින් ද්‍රව්‍ය පටිපාටියට තැබීමේ (ආරෝහණ සහ අවරෝහණ) තවත් ක්‍රියාකාරකම් කිහිපයක් සැලසුම් කර ගන්න.

  උදාහරණය:

  සිසුන් තිදෙනා බැගින් කණ්ඩායම් කරන්න. එක් එක් කණ්ඩායමට කාඩ්බෝඩ් හෝ ඝන කඩදාසිවලින් කපන ලද තරම වෙනස් එක ම හැඩයේ එක ම වර්ණයේ හැඩතල තුනක් බැගින් කුඩා පෙට්ටියකට හෝ බෑගයකට දමා දෙන්න. දැන් කණ්ඩායමේ එක් සිසුවකුට ඉවත බලා ගෙන එයින් එක් හැඩයක් ගෙන තමන් ගත් හැඩය මේසය මත තැබීමට කියන්න.

  තවත් සිසුවෙකුට තවත් හැඩයක් ගෙන පෙර සිසුවා තබන ලද හැඩය අසලින් තැබීමට කියන්න.

  ඊළඟ සිසුවාට ඉතුරු හැඩය රැගෙන අනෙක් හැඩ දෙක සමග සසඳා තරම අනුව අනුපිළිවෙළ ලැබෙන සේ එම හැඩ දෙක අසලින් තබන ලෙස කියන්න..

  සැම සිසුවෙකුට ම සැසඳීමට අවස්ථාව ලැබෙන සේ කිහිප වාරයක් ක්‍රියාකාරකමෙහි යොදවන්න. ඔවුන් අසලට ගොස් ප්‍රශ්න අසමින් සිසුන් නිවැරදි ව පටිපාටිගත කිරීම සිදු කරන්නේ ද යන්න තහවුරු කර ගන්න.

  මෙලෙස කණ්ඩායම් අතර හැඩ කට්ටල හුවමාරු කර ගනිමින් කිහිප වාරයක් ක්‍රියාකාරකමෙහි නිරත කරවිය හැකි ය.

- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ "**තරම අනුව අනුපිළිවෙළට තබමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම 3 සහ** 4 සඳහා අවස්ථාව දෙන්න.

**තක්සේරු කිරීම**

- සිසුන් කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකම්වල නිරත වන අතරතුරදී මෙන් ම තනි තනි ව ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථාව ලබා දී අදාළ ඉගෙනුම් පල අත්කර ගෙන ඇති ද යන්න තහවුරු කරගන්න.

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 එක ම හැඩයේ, එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනක් නිවැරදි වචන භාවිත කරමින් තරම අනුව එකිනෙක සමග සන්සන්දනය කරයි. | 1.1.1 | ද්‍රව්‍ය තුනකින් කුඩා, විශාල සහ විශාල ම ද්‍රව්‍ය නිවැරදි ව වෙන් කර දක්වයි. | ද්‍රව්‍ය තුනකින් කුඩා, විශාල සහ විශාල ම ද්‍රව්‍ය වෙන් කර දැක්වීමේ දුෂ්කරතා පෙන්වයි. |
| | 1.1.2 | ලොකු/ විශාල, ලොකු ම/ විශාල ම, කුඩා, කුඩා ම වචන නිවැරදි ව භාවිත කරයි. | ලොකු/ විශාල, ලොකු ම/ විශාල ම, කුඩා, කුඩා ම වචන භාවිත කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.1 සමාන හැඩයෙන් යුක්ත එක ම වර්ගයේ ද්‍රව්‍ය තුනක් තරම අනුව පටිපාටියට (අනුපිළිවෙළට) තබයි. | 2.1.1 | ද්‍රව්‍ය තුනක් විශාල ම ද්‍රව්‍යයේ සිට කුඩා ම ද්‍රව්‍යය තෙක් සහ කුඩා ම ද්‍රව්‍යයේ සිට විශාල ම ද්‍රව්‍යය තෙක් නිවැරදි ව අනුපිළිවෙළට තබයි. | ද්‍රව්‍ය තුනක් විශාල ම ද්‍රව්‍යයේ සිට කුඩා ම ද්‍රව්‍යය තෙක් සහ කුඩා ම ද්‍රව්‍යයේ සිට විශාල ම ද්‍රව්‍යය තෙක් අනුපිළිවෙළට තැබීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 3.1 එකම වර්ගයේ ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තබා ඇති ස්ථාන ප්‍රකාශ කරයි. | 3.1.1 | එකම වර්ගයේ ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තබා ඇති ස්ථාන දෙකක් ප්‍රකාශ කරයි. | එකම වර්ගයේ ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තබා ඇති ස්ථාන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 4.1 අවස්ථානුකූල ව විවිධ ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තබයි. | 4.1.1 | අවස්ථානුකූල ව ද්‍රව්‍ය තරම අනුව නිවැරදි ව අනුපිළිවෙළට තබයි. | අවස්ථානුකූල ව ද්‍රව්‍ය තරම අනුව අනුපිළිවෙළට තැබීමට උනන්දුවක් නො දක්වයි. |

# 6 රටා ගොඩනැඟීම

යම් පිළිවෙළකට තබා ඇති ද්‍රව්‍ය හෝ රූප හෝ රටාවක එම රටාව හඳුනා ගෙන තව දුරටත් රටාව ගොඩනැඟීමේ හැකියාව සිසුන් තුළ සංවර්ධනය කළ යුතු ය. සිසුන්ට පළමු ව ද්‍රව්‍ය මගින් පමණක් රටා ගොඩනැඟීමට වැඩි අවස්ථා සලසා දිය යුතු ය. පළමු ව ද්‍රව්‍ය දෙකක් යෙදෙන අවස්ථා යොදා ගන්න.

ද්‍රව්‍ය මගින් රටා ගොඩනැඟීම පිළිබඳ නිපුණතාව සිසුන් තුළ තහවුරු වූ පසු රූප රටා හඳුන්වා දීම සිදු කළ හැකි ය.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. රටාවකට තබා ඇති ද්‍රව්‍යවල රටාව හඳුනා ගෙන ඉදිරියට ගොඩනඟයි. | ▪ ද්‍රව්‍ය රටා හඳුනා ගැනීම හා ගොඩනැඟීම | 1.1 ද්‍රව්‍ය වර්ග දෙකක රටාව හඳුනා ගෙන එම රටාව තව දුරටත් ගොඩනඟයි. | 1.1.1 නිවැරදි හඳුනා ගැනීම<br>1.1.2 ගොඩනැඟීම නිවැරදි වීම |
| 2. ද්‍රව්‍ය මගින් සරල රටා ගොඩනඟයි. | ▪ ද්‍රව්‍ය වර්ග දෙකකින් යුතු රටා | 2.1 වර්ග දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් යොදා ගනිමින් රටා ගොඩනඟයි. | 2.1.1 ගොඩනැඟීම නිවැරදි වීම |
| 3. රූප රටාවක රටාව හඳුනා ගෙන ඉදිරියට ගොඩනඟයි. | ▪ වර්ග දෙකකින් යුතු රූප රටා | 3.1 වර්ග දෙකකින් යුතු රූප රටාවක රටාව හඳුනා ගෙන එය තව දුරටත් ඉදිරියට ගොඩනඟයි. | 3.1.1 නිවැරදි හඳුනා ගැනීම<br>3.1.2 ගොඩනැඟීම නිවැරදි වීම |
| 4. අවට පරිසරයේ දැකිය හැකි රටා පිළිබඳ සොයා බලයි. | ▪ අවට පරිසරයේ දැකිය හැකි රටා | 4.1 අවට පරිසරයේ රටා දැකිය හැකි ස්ථාන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 4.1.1 නිවැරදි හඳුනා ගැනීම |


**වාංමාලාව :**

රටා      ද්‍රව්‍ය රටාව      රූප රටාව

**ඉගෙනුම් සම්පත්**

- එක් වර්ගයකින් කිහිපයක් වන ලෙස රටා ගොඩනැඟිය හැකි ද්‍රව්‍ය
  උදාහරණ: විවිධ මල්, ගස්වල කොළ, බෝතල් මූඩි, ලොකු බොත්තම්/ ඇට වර්ග,
  ඝන කඩදාසිවලින් කපා ගත් විවිධ හැඩ
- මල් මාලයක් සැකසීමට පාට කඩදාසිවලින් කපා ගත් මල්
- කොඩි හෝ දම්වැල් සැකසීමට පාට කඩදාසි
- රූප රටා ගොඩනැඟීමට සුදුසු රූප සහිත පත්‍රිකා

උදා:



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

- වීඩියෝ දර්ශනයක් / පින්තූරයක් මගින් පරිසරයේ දක්නට ලැබෙන විවිධ රටා සිසුන්ට පෙන්වන්න.
  උදාහරණ: - කුරුල්ලන් පියඹා යාම (රටාවකට)
  - රෙදි මෝස්තර
  - පිඟන් ගඩොල් අල්ලා ඇති ස්ථාන.
- දකින ලද රටා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසුන් කැමති රටාවක් ඇඳීමට අවස්ථාව දෙන්න.
- සිසුන් අඳින ලද රටා පන්තියේ ප්‍රදර්ශනයට අවස්ථාව දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- අවට පරිසරයේ විවිධ ස්ථානවල හෝ විවිධ ද්‍රව්‍යවල හෝ රටා දැකිය හැකි අවස්ථා වීඩියෝ දර්ශනයක් මගින් හෝ රූප මගින් හෝ දැක ගැනීමට සලස්වන්න. ඒවායේ යම් කිසි රටාවක් ඇති බව හඳුනා ගැනීමට යොමු කරන්න. අපිත් ඒ ආකාරයේ රටා ගොඩනඟමු යැයි පවසමින් දරුවන් සමග වර්ග දෙකක ද්‍රව්‍ය කට්ටලයක් යොදා ගෙන රටාවක් ගොඩනඟන්න. ගොඩනැඟූ රටාව පැහැදිලි කරන්න.
- වෙනත් ද්‍රව්‍ය රටාවක් ගොඩනඟා, ඊළඟට තැබිය යුතු ද්‍රව්‍ය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. සිසු කණ්ඩායම්වලට ද්‍රව්‍ය බෙදා දී විවිධ රටා ගොඩනැඟීමට අවස්ථාව දෙන්න.
- ගොඩනඟන ලද රටා විස්තර කිරීමට ද අවස්ථාව දෙන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත | | ප්‍රවීණතාවට දුරස්ථ ය | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 1.1 ද්‍රව්‍ය වර්ග දෙකක රටාව හඳුනා ගෙන එම රටාව තව දුරටත් ගොඩනඟයි. | 1.1.1 | ද්‍රව්‍ය වර්ග දෙකක රටාව නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ද්‍රව්‍ය වර්ග දෙකක රටාව නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට කාලයක් ගත කරයි. | අන් අයගේ උදවු ඇති ව ද්‍රව්‍ය වර්ග දෙකක රටාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ද්‍රව්‍ය වර්ග දෙකක රටා හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| | 1.1.2 | රටාව තව දුරටත් ගොඩ නැඟීම සඳහා එම ද්‍රව්‍ය නිවැරදි ව අනුපිළිවෙළට තබයි. | රටාව තව දුරටත් ගොඩ නැඟීම සඳහා සමහර ද්‍රව්‍ය නිවැරදි ව අනුපිළිවෙළට තබයි. | අන් අයගේ උදවු ඇති ව රටාව තව දුරටත් ගොඩ නැඟීම සඳහා එම ද්‍රව්‍ය අනුපිළිවෙළට තබයි. | රටා ගොඩනැඟීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 2.1 වර්ග දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් යොදා ගනිමින් රටා ගොඩනඟයි. | 2.1.1 | වර්ග දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයකින් නිවැරදි ව රටා ගොඩනඟයි. | වර්ග දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයකින් සුළු අඩුපාඩු සහිත ව රටා ගොඩනඟයි. | අන් අයගේ උදවු ඇති ව වර්ග දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයකින් රටා ගොඩනඟයි. | රටා ගොඩනැඟීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

**ක්‍රියාකාරකම 3**

ද්‍රව්‍ය මගින් රටා ගොඩනැඟීම නැවත මතක් කරන්න.

- රූප සහිත පත්‍රිකා යොදා ගෙන රූප රටා ගොඩනැඟීම හඳුන්වා දෙන්න.
- රූප පත්‍රිකාවල ඇති රටාව කළුලෑල්ලේ ඇඳ එහි ඊළඟට ආ යුතු රූපය සිසුන්ගෙන් විමසමින් ඉදිරියට රටාව අඳින්න.
- තවත් රූප රටා කිහිපයක ඊළඟට ආ යුතු රූපය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතෙහි **"රටා ගොඩනගමු"** පාඩමෙහි **ක්‍රියාකාරකම 1, 2 සහ 3** සම්පූර්ණ කිරීමට අවස්ථාව දෙන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 3.1 වර්ග දෙකකින් යුතු රූප රටාවක රටාව හඳුනා ගෙන එය තව දුරටත් ඉදිරියට ගොඩනගයි. | 3.1.1 | වර්ග දෙකකින් යුතු රූප රටාවක රටාව නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | වර්ග දෙකකින් යුතු රූප රටාව නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට කාලයක් ගත කරයි. | අන් අයගේ උදවු ඇති ව වර්ග දෙකකින් යුතු රූප රටාවක රටාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ද්‍රව්‍ය වර්ග දෙකකින් යුතු රූප රටා හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| | 3.1.2 | රටාව තව දුරටත් ගොඩනැඟීම සඳහා ඊළඟට ආ යුතු රූප නිවැරදි ව නම් කරයි. | රටාව තව දුරටත් ගොඩනැඟීම සඳහා ඊළඟට ආ යුතු රූප සුළු අඩුපාඩු සහිත ව නම් කරයි. | අන් අයගේ උදවු ඇති ව රටාව තව දුරටත් ගොඩනැඟී ම සඳහා ඊළඟට ආ යුතු රූප නම් කරයි. | රටාව තවදුරටත් ගොඩනැඟීම සඳහා ඊළඟට ආ යුතු රූප හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 4.1 අවට පරිසරයේ රටා දැකිය හැකි ස්ථාන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 4.1.1 | අවට පරිසරයේ රටා දැකිය හැකි ස්ථාන ප්‍රකාශ කරයි. | අවට පරිසරයේ රටා දැකිය හැකි ස්ථානයක් ප්‍රකාශ කරයි. | අන් අයගේ උදවු ඇති ව අවට පරිසරයේ රටා දැකිය හැකි ස්ථාන ප්‍රකාශ කරයි. | අවට පරිසරයේ රටා දැකිය හැකි ස්ථාන හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

# 7 | 10 තෙක් ද්‍රව්‍ය සහ රූප ගණන් කිරීම

ගණන් කිරීමේදී පූර්ව ගණිත සංකල්ප ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් ලබා ගත් අද්දැකීම් ප්‍රායෝජනවත් වේ. විශේෂයෙන් ම එකට එක අනුරූපතාව, තේරීම, අවිචලතාව වැනි පූර්ව ගණිත කුසලතා ගණන් කිරීමේ කුසලතාව වර්ධනය සඳහා මූලික පදනම සපයයි. ගණන් කිරීමේදී විශාලත්වය පිළිබඳ හැඟීමෙන් ගැනෙන සංඛ්‍යාවලදී සංඛ්‍යා නාමය සමග ප්‍රමාණාත්මක බව දැක්වෙන බව ද සිසුන්ට අවබෝධ කරවිය යුතු ය. (උදාහරණ වශයෙන් සංඛ්‍යා නාමය පහ නම් එහි ද්‍රව්‍ය/ රූප ප්‍රමාණයක් ඇති බව) ගණන් කිරීමේ හැකියාව වර්ධනයේදී පළමුව ද්‍රව්‍ය ගණන් කිරීම ද දෙවනුව රූප ගණන් කිරීම ද සිදු කෙරේ. රූප ගණන් කිරීමේදී පිළිවෙළකට පිහිටි සහ පිළිවෙළකට නොපිහිටි රූප ගණන් කිරීමේ අවස්ථා යොදා ගත යුතු ය.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. ප්‍රමාණය සංඛ්‍යාත්මක ව හඳුනා ගැනීම සඳහා ද්‍රව්‍ය කට්ටලයක් ගණන් කරයි. | ▪ 1 සිට 10 තෙක් සංඛ්‍යා නාම<br>▪ 1 සිට 10 තෙක් ද්‍රව්‍ය ප්‍රමාණ ගණන් කිරීම | 1.1 1 සිට 10 තෙක් වූ සංඛ්‍යා නාම අනුපිළිවෙළින් හඳුනා ගනියි. | 1.1.1 හඳුනා ගැනීම නිවැරදි වීම |
| | | 1.2 1 සිට 10 තෙක් වූ එක ම වර්ගයේ ද්‍රව්‍ය සංඛ්‍යාවක් නිවැරදි ව ගණන් කර ද්‍රව්‍ය සංඛ්‍යාව ප්‍රකාශ කරයි. | 1.2.1 ගණන් කිරීම නිවැරදි වීම<br>1.2.2 සංඛ්‍යාව නිවැරදි වීම |
| | | 1.3 1 සිට 10 තෙක් සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ගණන් කර ඉදිරිපත් කරයි. | 1.3.1 ගණන් කිරීම නිවැරදි වීම<br>1.3.2 සංඛ්‍යාව නිවැරදි වීම |
| 2. රූප කට්ටලයක ඇති රූප ප්‍රමාණය සංඛ්‍යාත්මක ව හඳුනා ගැනීම සඳහා ගණන් කරයි. | ▪ රටාවකට පිහිටි රූප 10ක් තෙක් ගණන් කිරීම<br>▪ රටාවකට නොපිහිටි රූප 10ක් තෙක් ගණන් කිරීම | 2.1 රටාවකට (පිළිවෙළකට) පිහිටි එක ම වර්ගයේ රූප 10 තෙක් ප්‍රමාණයක් නිවැරදි ව ගණන් කරයි. | 2.1.1 ගණන් කිරීම නිවැරදි වීම |
| | | 2.2 රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 10 තෙක් ප්‍රමාණයක් නිවැරදි ව ගණන් කරයි. | 2.2.1 ගණන් කිරීම නිවැරදි වීම |

වාංමාලාව :


ගණන් කිරීම — එක, දෙක,........., නවය, දහය


**ඉගෙනුම් සම්පත්**

ගණක ලෙස භාවිත කළ හැකි විවිධ ද්‍රව්‍ය 10 බැගින් වූ කට්ටල කිහිපයක් (කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ද ප්‍රමාණවත් වන අයුරින්)


- සුදු ඩිමයි කොළයක් සහ එක ම වර්ගයේ තරමක් ලොකු රූප 10ක්
- එක ම වර්ගයේ රූප 5ක්, 6ක්, 7ක්, 8ක්, 9ක් සහ 10ක් බැගින් ඇතුළත් තරමක් විශාල රූප පත්‍රිකා

  උදාහරණ : පිළිවෙළකට පිහිටි රූප අලවන/අඳින ලද පත්‍රිකා





පිළිවෙළකට නොපිහිටි රූප අලවන/අඳින ලද පත්‍රිකා



- ගණන් කිරීමේ දණ්ඩ (Counting rod)
  මීටරයක පමණ ප්‍රමාණයේ කොහුමිටක් වැනි දණ්ඩක් රැගෙන එහි සමාන කොටස් 10ක් වර්ණ දෙකකින් හෝ කිහිපයකින් වර්ණ ගන්වන්න.



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ද්‍රව්‍ය 10ක් ගණන් කිරීම**

- සිසුන් කණ්ඩායම් කරන්න. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ ව, සිසුන් එළිමහනේ නිරීක්ෂණයට ගොස් පැමිණෙන විට ගල් කැට, ඇට වර්ග, ගස්වල බිම වැටී ඇති වියළි මල් හෝ කොළ වැනි තමන්ට කැමති දෙයකින් කිහිපයක් පන්තියට රැගෙන එන ලෙස කියන්න. මෙහිදී සිසුන් එක් කණ්ඩායමකට එක ම ද්‍රව්‍යය රැගෙන එන්න යැයි කිව හැකි ය.
- තම කණ්ඩායමේ සිසුන් අහුලා ගෙන ආ ද්‍රව්‍ය මේසය මත තබා ඔවුන්ට හැකි අයුරින් කොපමණ තිබේ දැයි ගණන් කර බලන ලෙස කියන්න. බොහෝ විට ද්‍රව්‍ය හෝ රූප 5ක් තෙක් ගණන් කිරීමේ හැකියාව සිසුන්ට ලැබී ඇත. ඔවුන් ඒවා ගණන් කරන්නේ කෙසේ දැයි නිරීක්ෂණය කරන්න. පහකට වැඩි ද්‍රව්‍ය නැති කණ්ඩායම්වලට එම ද්‍රව්‍යය ම තවත් ලබා දෙන්න. 10කට වඩා වැඩි ද්‍රව්‍ය ප්‍රමාණ ඉවත් කරන්න.
- එක් එක් කණ්ඩායම ළඟ ඇති ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණ දැයි අහන්න. පන්තිය ඉදිරියට පැමිණ එම ද්‍රව්‍ය ගණන් කර පෙන්වීමට අවස්ථාව දෙන්න.

| |
|---|
| **මෙම කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළ දුෂ්කරතා පෙන්වන සිසුන් බොහෝ විට අනෙක් සිසුන්ට සවන් දී ඉගෙන ගැනීමට යොමු වේ.** |

- දැන් තරමක් විශාල ද්‍රව්‍ය (පෙට්ටි වැනි) 10ක් රැගෙන එකින් එක ගණන් කරන අයුරු සිසුන් ද සහභාගි කර ගනිමින් ආදර්ශනය කරන්න.
- කණ්ඩායම් තුළ නිරීක්ෂණයේදී හඳුනා ගත් ගණන් කිරීමේ අපහසුතා සහිත සිසුන් ඉදිරියට කැඳවමින් අනෙක් අයගේ ද සහයෙන් ගණන් කිරීමට අවස්ථාව දෙන්න.

**ද්‍රව්‍ය ගණන් කිරීම තව දුරටත්**

- අවුරුදු දා ගෙදරදොර සිදු වන සිදුවීම් ඇසුරෙන් අද්දැකීම් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න. පහත කරුණු මතු වන ලෙස සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අවුරුදු කෑම මේසය (කැවුම්, කෙසෙල්.)
  - ගෙදරට එන නෑදෑයින්
- වීඩියෝ දර්ශනයක් මගින්/ පින්තූරයක්/ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ අපේ උරුමය තේමාව යටතේ 'අවුරුදු කෑම මේසය' ඇසුරෙන්

- කැවිලි ගණන් කිරීම
- ගෙදරට එන නෑදෑයන් ගණන් කිරීම සිසුන් සමග සිදු කරන්න.

- 'අවුරුදු කෑම මේසය' චිත්‍රයට නැගීමට අවස්ථාව දෙන්න.
- සංඛ්‍යා නාම අනුපිළිවෙළින් මතක තබා ගැනීමේ පහසුව සඳහා අත්පුඩි ගසමින් හෝ අත්දෙකේ ඇඟිලි ගණන් කරමින් හෝ ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- මෙහිදී අතේ ඇඟිලි හෝ ගණන් කිරීමේ දණ්ඩ හෝ උපයෝගී කරගෙන 1 සිට 10 තෙක් ගණන් කිරීම මෙන් ම 10 සිට 1 තෙක් ආපස්සට සංඛ්‍යා නාම කීම ද සිදු කරන්න.
- සෑම සිසුවෙකුට ම ගණන් කිරීමේ අවස්ථාව ලබා දෙන්න.
- ද්‍රව්‍ය 10ක් ගණන් කිරීමේ හැකියාව තව දුරටත් සිසුන් තුළ තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 1.1 1 සිට 10 තෙක් වූ සංඛ්‍යා නාම අනුපිළිවෙළින් හඳුනා ගනියි. | 1.1.1 | 1 සිට 10 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් නිවැරදි ව කියයි. | 1 සිට 7 තෙක් වත් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් නිවැරදි ව කියයි. | 1 සිට 6 තෙක් වත් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් නිවැරදි ව කියයි | 5 හෝ එයට අඩු සංඛ්‍යා තෙක් සංඛ්‍යා නාම කියයි. |
| 1.2 1 සිට 10 තෙක් වූ එක ම වර්ගයේ ද්‍රව්‍ය සංඛ්‍යාවක් නිවැරදි ව ගණන් කර ද්‍රව්‍ය සංඛ්‍යාව ප්‍රකාශ කරයි. | 1.2.1 | එක ම වර්ගයේ ද්‍රව්‍ය 10ක් නිවැරදි ව ගණන් කරයි. | එක ම වර්ගයේ ද්‍රව්‍ය 7ක් වත් නිවැරදි ව ගණන් කරයි. | එක ම වර්ගයේ ද්‍රව්‍ය 6ක් වත් නිවැරදි ව ගණන් කරයි. | එක ම වර්ගයේ ද්‍රව්‍ය 5 හෝ එයට අඩු සංඛ්‍යාවක් ගණන් කරයි. |
| | 1.2.2 | එම ද්‍රව්‍ය සංඛ්‍යාව නිවැරදි ව ප්‍රකාශ කරයි. | එම ද්‍රව්‍ය සංඛ්‍යාව නිවැරදි ව ප්‍රකාශ කරයි. | එම ද්‍රව්‍ය සංඛ්‍යාව නිවැරදි ව ප්‍රකාශ කරයි. | එම ද්‍රව්‍ය සංඛ්‍යාව නිවැරදි ව ප්‍රකාශ කරයි. |
| 1.3 1 සිට 10 තෙක් සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ගණන් කර ඉදිරිපත් කරයි. | 1.3.1 | 1 සිට 10 තෙක් ඕනෑ ම සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ගණන් කරයි. | 1 සිට 7 තෙක් ඕනෑ ම සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ගණන් කරයි. | 1 සිට 5 තෙක් ඕනෑ ම සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ගණන් කරයි. | 5 ට අඩු සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ගණන් කරයි. |
| | 1.3.2 | අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ඉදිරිපත් කරයි. | අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ඉදිරිපත් කරය | අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ඉදිරිපත් කරයි. | අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදි ව ඉදිරිපත් කරයි. |

**රටාවකට පිහිටි රූප ගණන් කිරීම**

පළමු ව රටාවකට පිහිටි එක ම වර්ගයේ රූප 10ක් ගණන් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (ඔවුන් මේ වන විට ද්‍රව්‍ය 10ක් ගණන් කිරීමේ හැකියාවෙන් යුක්ත ය.) ඒ සඳහා පහත ආකාරයේ ක්‍රියාකාරකමක් යොදාගත හැකි ය.

උදාහරණ:

- සිසුන් සියලු දෙනාට ම පෙනෙන ලෙස ඩිමයි කොළයක් ජ්ලැනල් පුවරුවේ හෝ කළුලැල්ල මත රඳවා ගන්න.
- එක ම වර්ගයේ රූප 10ක් දමූ භාජනය ගුරු මේසය මත තබන්න.
- රූප තුනක් පමණ ඩිමයි කොළය මත රටාවකට පිහිටන ලෙස ගණන් කරමින් අලවන්න.
- රටාවකට ඇලවීමේදී අනුපිළිවෙළ වැදගත් බව පැහැදිලි කරන්න.
- ඒ අනුව ඉතුරු රූප ඇලවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඉන්පසු පන්ති කාමරයේ සියලු සිසුන් සහභාගි කර ගනිමින් කෝටුවක්/ ඉරටුවක් භාවිත කර රූපයෙන් රූපයට තබමින් අනුපිළිවෙළින් ගණන් කරන්න.
- සෑම රූපයක් යටින් ම √ ලකුණක් දමමින් නැවත අනුපිළිවෙළට ගණන් කරන්න.

- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න. කණ්ඩායම්වලට රටාවකට පිහිටි රූප සහිත කාඩ්පත් බෙදා දෙන්න. එහි ඇති රූප ගණන නිවැරදි ව ගණන් කර පැවසීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ "**ගණන් කරමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 1 සහ 2 කිරීමට අවස්ථාව දෙන්න.

**තක්සේරු කරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 2.1 රටාවකට (පිළිවෙළකට) පිහිටි එක ම වර්ගයේ රූප 10 තෙක් ප්‍රමාණයක් නිවැරදි ව ගණන් කරයි. | 2.1.1 | රටාවකට (පිළිවෙළකට) පිහිටි එක ම වර්ගයේ රූප 10ක් නිවැරදි ව ගණන් කරයි. | රටාවකට (පිළිවෙළකට) පිහිටි එක ම වර්ගයේ රූප 8ක් වත් නිවැරදි ව ගණන් කරයි. | රටාවකට (පිළිවෙළකට) පිහිටි එක ම වර්ගයේ රූප 6ක් නිවැරදි ව ගණන් කරයි. | රටාවකට (පිළිවෙළකට) පිහිටි එක ම වර්ගයේ රූප 5ක් හෝ එයට අඩු සංඛ්‍යාවක් ගණන් කරයි. |

**රටාවකට නොපිහිටි රූප ගණන් කිරීම**

- රටාවකට පිහිටි රූප ගණන් කිරීමෙන් පසු රටාවකට නොපිහිටි රූප ගණන් කිරීම සිදු කරන ආකාරය හඳුන්වා දෙන්න. මෙහිදී එදිනෙදා ජීවිතයේ රටාවකට නොපිහිටි දේ ගැන සිසුන් සමග කතා බහ කරන්න. ගණන් කිරීමට ලැබෙන අවස්ථාවන් මතු කරන්න.
  උදා: මිදි පොකුරක ඇති ගෙඩි ගණන් කිරීම, ගසකින් කඩන පොල්ගෙඩි ගණන් කිරීම
- සිසු කණ්ඩායම්වලට රටාවකට නොපිහිටි රූප සහිත පත්‍රිකා ලබා දී ඒවායේ රූප ගණන් කිරීමට කියන්න. කණ්ඩායම් අතර කාඩ්පත් හුවමාරු කර ගනිමින් තව දුරටත් ගණන් කිරීමට අවස්ථාව දෙන්න.
- රටාවකට නොපිහිටි රූප ගණන් කිරීමේදී සලකුණක් යොදමින් ගණන් කිරීම සිදු කරන ආකාරය පෙන්වා දෙන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ "**ගණන් කරමු**" පාඩමෙහි **ක්‍රියාකාරකම** 3 කිරීමට අවස්ථාව දෙන්න.

තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 2.2 රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 10 තෙක් ප්‍රමාණයක් නිවැරදි ව ගණන් කරයි. | 2.2.1 | රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 10ක් නිවැරදි ව ගණන් කරයි. | රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 8ක් වත් නිවැරදි ව ගණන් කරයි. | රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 6ක් වත් නිවැරදි ව ගණන් කරයි. | රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 5ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ගණන් කරයි. |




# 8 | 1 සිට 5 තෙක් සංඛ්‍යා හඳුනා ගැනීම

ගණන් කිරීමේදී විශාලත්වය පිළිබඳ හැඟීමෙන් ගැනෙන සංඛ්‍යාවලදී සංඛ්‍යා නාමය සමග එහි ප්‍රමාණාත්මක බව දක්වෙන බව ද සිසුන්ට අවබෝධ කරවිය යුතු ය. (උදාහරණ වශයෙන් සංඛ්‍යා නාමය පහ නම් එහි ද්‍රව්‍ය/ රූප ප්‍රමාණයක් ඇති බව) මෙම ක්‍රියාකාරකම්වල සංඛ්‍යා හඳුන්වා දීමේදී සංඛ්‍යා නාම ප්‍රකාශ කිරීම, ද්‍රව්‍ය ඇසුරෙන් ප්‍රමාණය පෙන්වීම හා සංඛ්‍යාංක හඳුනා ගැනීමේ හැකියාව සිසුන් තුළ ඇති කිරීම අපේක්ෂා කෙරේ. (මෙම වාරය තුළදී විධිමත් ව ඉලක්කම් ලිවීම අපේක්ෂා නො කෙරේ.)

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| 1. සංඛ්‍යා හඳුනා ගෙන දෛනික අවශ්‍යතාවලදී අර්ථාන්විත ව භාවිත කරයි. | ■ 1 සිට 5 තෙක් වූ සංඛ්‍යාංක කියවීම<br>■ 1 සිට 5 තෙක් වූ සංඛ්‍යා ද්‍රව්‍ය සහ රූප මගින් නිරූපණය | 1.1 1 සිට 5 තෙක් වූ ඕනෑ ම සංඛ්‍යාංකයක් නිවැරදි ව කියවයි. | 1.1.1 කියවීම නිවැරදි වීම |
| | | 1.2 1 සිට 5 තෙක් වූ ද්‍රව්‍ය ප්‍රමාණයකට අනුරූප වන සංඛ්‍යාංකය පෙන්වයි. | 1.2.1 සංඛ්‍යාංකය නිවැරදි වීම |
| | | 1.3 1 සිට 5 තෙක් වූ රූප ප්‍රමාණයකට අනුරූප වන සංඛ්‍යාංකය පෙන්වයි. | 1.3.1 සංඛ්‍යාංකය නිවැරදි වීම |

**වාංමාලාව :**
සංඛ්‍යාව ඉලක්කම සංඛ්‍යාංකය
සංඛ්‍යා නාමය එක, දෙක, තුන, හතර, පහ

**ඉගෙනුම් සම්පත් :**
- ගණක ලෙස භාවිත කළ හැකි විවිධ ද්‍රව්‍ය
  උදා: ගල්කැට, ඇට වර්ග
- මල්, පලතුරු, සතුන් වැනි රූප එකක්, දෙකක්, තුනක්, හතරක් සහ පහක් බැගින් අඳින ලද රූප පත්‍රිකා
  උදා :-

- 1, 2, 3, 4 සහ 5 ලියූ සංඛ්‍යා පත්
- 1 සිට 5 තෙක් සංඛ්‍යාංක සහිත හිඩැස් පත් (පැස්ටල් එකකින් ඇතුළත පාට කිරීමට ප්‍රමාණවත් වන හිඩැසක් අවශ්‍යයි.)
- බිම හෝ තැටියක හෝ දමන ලද සිනිඳු වැලි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**
සිසුන් දැනටමත් සංඛ්‍යා සහ ගණන් කිරීම් පිළිබඳ යම් කිසි දැනුමකින් යුක්ත ය. ඔවුන්ට නිවැරදි ව අනුපිළිවෙළට සංඛ්‍යා භාවිතය පිළිබඳ දැනුමක් හෝ හැකියාවක් නොමැති වුව ද නිවසේ විවිධ කාර්යයන්හිදී සංඛ්‍යා භාවිත වන බව ඔවුන් දැනුවත් ය. එබැවින් පහත ආකාරයේ ප්‍රායෝගික ක්‍රියාකාරකමක් මගින් සංඛ්‍යා හඳුන්වා දීම ආරම්භ කළ හැකි ය. එසේ නොමැති නම් සිසුන් එළිමහනට රැගෙන ගොස් කළ හැකි ක්‍රීඩාවක් ද මේ සඳහා සැලසුම් කර ගත හැකි ය.

**ක්‍රියාකාරකම 1**


- තමන්ගේ පවුලේ සිටින සාමාජිකයන් ගණන කීය දැයි සිසුන්ගෙන් විමසන්න. (මෙහිදී සමහර සිසුන්ට ප්‍රමාණය නිවැරදි ව පැවසීමට අපහසු විය හැකි ය. එවිට ඔවුන් කවුරුන් දැයි ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.)
- සමහර සිසුන්ට පවුලේ සාමාජිකයන් ගණන නිවැරදි ව ප්‍රකාශ කිරීමට නොහැකි වුවද ඔවුන්ගේ අතේ ඇඟිලි මගින් දක්වයි. එවැනි අයට ද අවස්ථාව දෙන්න.
- ඉහත ආකාරයට ප්‍රමාණය සමග සම්බන්ධ කරමින් ක්‍රීඩාවක් හෝ කතන්දරයක් මගින් 1 සිට 5 තෙක් සංඛ්‍යා හඳුන්වා දෙන්න.

  උදා: ක්‍රීඩාවක් ලෙස
    - ගුරුතුමිය 1 කියන විට එක් ද්‍රව්‍යයක් පෙන්වීම
    - ගුරුතුමිය 2 කියන විට ද්‍රව්‍ය 2ක් පෙන්වීම
    - මේ ආකාරයට පිළිවෙළින් ද්‍රව්‍ය 5ක් තෙක් හඳුන්වා දීම
    - ඉන්පසු 5 සිට 1 තෙක් ආපස්සට සංඛ්‍යා කීම ද සිදු කරන්න.

**ක්‍රියාකාරකම 2**

**1 සිට 3 තෙක් සංඛ්‍යාංක හඳුන්වා දීම**

- පහ තෙක් ගණන් කිරීම නැවත මතක් කිරීම සඳහා රූප එකක්, දෙකක්, තුනක්, හතරක් සහ පහක් බැගින් අඳින ලද රූප පත්‍රිකාවලින් වරකට එක බැගින් පෙන්වමින් ඒවායේ ඇති රූප සංඛ්‍යාව කීමට යොමු කරන්න.
- 1 සිට 3 තෙක් සංඛ්‍යා පත් පෙන්වමින් එම සංඛ්‍යාංක හඳුන්වා දෙන්න.
- සංඛ්‍යාංක තව දුරටත් හඳුනා ගැනීම සඳහා සිසුන් තිදෙනා බැගින් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට ගණක වර්ගයකින් 10ක් පමණ ද 1, 2 සහ 3 ලියන ලද සංඛ්‍යා පත් කට්ටලය බැගින් ද ලබා දෙන්න.
- මේසය මත සංඛ්‍යා පත් වෙන වෙන ම තබා එක් එක් සංඛ්‍යා පතේ ඇති සංඛ්‍යාංකයට ගැළපෙන ගණක සංඛ්‍යාව ඒවා අසලින් තැබීමට කියන්න.





- එක් එක් කණ්ඩායම් අසලට ගොස් ඔවුන් නිවැරදි ව ගණක තැබීම සිදු කර තිබේ ද යන්න විමසා බලන්න. සැම සිසුවකු ලවා ම එම සංඛ්‍යාංක කියවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම අවසානයේ අහඹු ලෙස සිසුන් නම් කරමින් සංඛ්‍යාවක් කියූ විට එය ඔවුන් ළඟ ඇති සංඛ්‍යා පත් මගින් පෙන්වීමට අවස්ථාව දෙන්න.
- සැම සිසුවකු ම සංඛ්‍යාංක හඳුනා ගත් බව තහවුරු වන තෙක් මෙම ක්‍රියාකාරකම කිහිප වරක් කරන්න.

**ක්‍රියාකාරකම 3**

**රූප ඇසුරෙන් සංඛ්‍යා හඳුන්වා දීම**

- රූප එකක් හෝ දෙකක් හෝ තුනක් සහිත පත්‍රිකාවක් සියලු දෙනාට ම පෙනෙන අයුරින් ප්ලැනල් පුවරුවක හෝ කළුලෑල්ලේ හෝ රඳවන්න. එහි රූප කීයක් තිබේ දැයි විමසන්න.
- සිසුවකුට පැමිණ එහි ඇති රූප සංඛ්‍යාවට අදාළ සංඛ්‍යා පත තෝරන ලෙස පවසා එය රූප සහිත පත්‍රිකාවට යටින් රඳවන්න.



- තවත් රූප පත්‍රිකා ගෙන ඒ ආකාරයට ම සංඛ්‍යාංක හා ගළපන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමේ සිසුන් කිහිප දෙනෙකුට රූප පත්‍රිකා ද, අනෙක් අයට සංඛ්‍යා පත් ද ලබා දී, එක් සිසුවකු රූප පත්‍රිකාවක් මේසය මත තැබූ විට අනෙක් සිසුවෙකුට එයට අදාළ සංඛ්‍යා පත ඉදිරියෙන් තබන ලෙස පවසන්න.
- සියලු ම රූප පත්‍රිකා සහ අදාළ සංඛ්‍යා පත් ඔවුන් ඉදිරියේ මේසය මත තැබූ පසු සියලු දෙනාට ම එකතු වී ඒවා නිවැරදි දැයි බලන ලෙසට උපදෙස් දෙන්න.
- සිසුන් අතර රූප පත්‍රිකා සහ සංඛ්‍යා පත් හුවමාරු කර ගෙන ඉහත ක්‍රියාකාරකම නැවත සිදු කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ **"සංඛ්‍යා කියවමු"** පාඩමෙහි **ක්‍රියාකාරකම 1 සහ 2** සඳහා අවස්ථාව දෙන්න.

**ක්‍රියාකාරකම 4**

**සංඛ්‍යාංක නිවැරදි ව ලියන අයුරු හඳුන්වා දීම**

- '|' සංඛ්‍යාංකය ලිවීමට හුරු කිරීම සඳහා සියලු දෙනාට ම පෙනෙන අයුරින් කළුලෑල්ලේ හතරැස් කොටුවක් ඇඳ '|' ඉලක්කම ලියන ආකාරය පැහැදිලි ව ආදර්ශනය කරන්න.

**1**

- '|' අහසේ ඇඟිල්ලෙන් ඇඳ පෙන්වීමට සිසුන්ට කියන්න.
- බිම හෝ බ්‍රිස්ටල් බෝඩ් එකක '|' විශාල ව ලියා ඉලක්කම ආරම්භක ස්ථානයේ සිට ගල්කැට/ලොකු ඇට වර්ගයක් තැබීමට යොමු කරන්න. පටන් ගන්නා ස්ථානය සලකුණු කර දෙන්න.
- සපයා ගත් සිනිඳු වැලිවල එක ඉලක්කම ඇඟිල්ලෙන් ඇඳීමට අවස්ථාව දෙන්න.
- සිසුන් නිවැරදි ව උඩ සිට පහළට '|' අඳින්නේ ද යන්න නිරීක්ෂණය කරන්න.
- '|'සංඛ්‍යාංකය සහිත හිඩැස්පත යොදා ගෙන හිඩැස ඇතුළත පාට කිරීමට දෙන්න.

|

**ක්‍රියාකාරකම 5**

- ඉහත ආකාරයට 2 සහ 3 ඉලක්කම් ද හඳුන්වා දෙන්න. පටන් ගන්නා ස්ථානය සහ හැඩය නිවැරදි ව ගන්නේ ද යන්න නිරීක්ෂණය කරන්න. අවශ්‍ය සිසුන්ට උදවු කරන්න.
- සංඛ්‍යාංක හිඩැස්පත් යොදා ගෙන හිඩැස ඇතුළත පාට කිරීමට දෙන්න.

2 3

**ක්‍රියාකාරකම් තව දුරටත් :**

**'4' සහ '5'සංඛ්‍යාංක හඳුනා ගැනීම**

- 1, 2 සහ 3 සංඛ්‍යා හඳුන්වා දුන් (ක්‍රියාකාරකම් 1, 2, 3 සහ 4) ආකාරයට ම ''හතර'' සහ ''පහ'' සංඛ්‍යාංක හඳුන්වා දෙන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ **"සංඛ්‍යා කියවමු"** පාඩමෙහි **ක්‍රියාකාරකම** 3 කිරීමට අවස්ථාව දෙන්න.

**එක් දිනකදී එක් සංඛ්‍යාංකය බැගින් ලියන ආකාරය හඳුන්වා දෙන්න.**

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක අංකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | හතරවන මට්ටම | තුන්වන මට්ටම | දෙවන මට්ටම | පළමුවන මට්ටම |
| 1.1 1 සිට 5 තෙක් වූ ඕනෑ ම සංඛ්‍යාංකයක් නිවැරදි ව කියවයි. | 1.1.1 | 1 සිට 5 තෙක් සංඛ්‍යාංක නිවැරදි ව කියවයි. | සංඛ්‍යාංක 4ක් නිවැරදි ව කියවයි. | සංඛ්‍යාංක 2ක් හෝ 3ක් හෝ පමණක් නිවැරදි ව කියවයි. | එක් සංඛ්‍යාංකයක් පමණක් නිවැරදි ව කියවයි. |
| 1.2 1 සිට 5 තෙක් වූ ද්‍රව්‍ය ප්‍රමාණයකට අනුරූප වන සංඛ්‍යාංකය පෙන්වයි. | 1.2.1 | 1 සිට 5 තෙක් ද්‍රව්‍යවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. | 1 සිට 4 තෙක් ද්‍රව්‍ය ප්‍රමාණවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. | 1 සිට 3 තෙක් ද්‍රව්‍ය ප්‍රමාණවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. | ද්‍රව්‍ය 3ට අඩු ප්‍රමාණවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. |
| 1.3 1 සිට 5 තෙක් වූ රූප ප්‍රමාණයකට අනුරූප වන සංඛ්‍යාංකය පෙන්වයි. | 1.3.1 | 1 සිට 5 තෙක් රූපවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. | 1 සිට 4 තෙක් රූප ප්‍රමාණවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. | 1 සිට 3 තෙක් රූප ප්‍රමාණවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. | රූප 3ට අඩු ප්‍රමාණවලට අනුරූප වන සංඛ්‍යාංක නිවැරදි ව පෙන්වයි. |

- ප්‍රවීණතාවට ආසන්න සහ ප්‍රවීණතාවට නොපැමිණි සිසුන් අදාළ ප්‍රවීණතාවට ළඟා කර වීම සඳහා තව දුරටත් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**පැහැදිලි කිරීම සඳහා 'සංඛ්‍යාංකය' යන පදය මෙහි භාවිත කළ ද පළමුවන ශ්‍රේණියේ සිසුන් සඳහා සංඛ්‍යාංකය වෙනුවට 'ඉලක්කම' යන පදය භාවිත කළ හැකි ය.**